# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,529- 2007 දෙසැම්බර් 20 වැනි බ්‍රහස්පතින්දා - 2007.12.20

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1174 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1150 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 1177 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 1201 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 දෙසැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 දෙසැම්බර් මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 509

DRF/RECT/580(IV)AY.

යුසේලේශා/පා/6/1(පීඕඑස්) (82) හා 2006.08.22
දිනැති ලිපියට ඇමුණුම "අ" වශයෙන්

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් හා මරණින් පසු උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරීගේ නිලය උසස් කිරීම/මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ක්‍රිශාන්ත චන්දික ජයනාත්, විපාරෙ

(1) 2005 ජුනි මස 01 දින සිට මේජර් නිලයට උසස් කිරීම
(2) 2006 අගෝස්තු මස 12 දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

12-461

---

2007 අංක 510

DRF/21/RECT/2475.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරී 2006 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) කුරුප්පු මුදියන්සේලාගේ නිමල් සෝමසිරි, ශ්‍රීලපාහ (නි/62645)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

12-456

---

2007 අංක 511

DVF/RECT/264AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### මරණයෙන් පසු අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 නොවැම්බර් මස 18 වැනි දින සිට මේජර් (උපකරණ පාලක) (පොදු රාජකාරී) නිලයට මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

කපිතන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) රත්නායක මුදියන්සේලාගේ සුබසිංහ, ශ්‍රීලංජාආබමු (නි/5126)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

12-598

---

DVF/RECT/260.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව –ස්වේච්ඡා බල සේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම

#### අපකීර්ති සහගත ලෙස ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරී 2005 ජූලි මස 20 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ශ්‍යාමන් වසන්තකුමාර විජේතුංග ගරෙ (නි/2945)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-462/1

---

ලුතිනන් අම්බලන්දූව කන්කානම්ගේ චාන්දනී ශ්‍රීලයුකාබ (නි/5632)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 දින,
කොළඹ දී ය.

12-459/1

---

2007 අංක 512

DVF/RECT/215AY(2).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

කපිතන් ජෙරමි අර්නස්ට් බර්නඩත් කෙලාර්ට්, ශ්‍රීලපාභ (නි/2583)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ දී ය.

12-597

---

2007 අංක 513

DVF/RECT/143(V)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ස්වේච්ඡා උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 සැප්තැම්බර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ගල්පොත්තගේ මහින්දදාස පෙරේරා ශ්‍රීලංජාආබමු (නි/5149)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අන පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-458

---

DVF/RECT/9AY(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරයෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිණී 2006 සැප්තැම්බර් මස 01 වන දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

---

2007 අංක 514

DVF/RECT/9AY(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරයෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරිණිය 2007 ජනවාරි මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කෝණාර මුදියන්සේලාගේ සධානා සංජීවනී කෝණාර ශ්‍රීලයුකාබ (නි/5527)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-459/2

---

2007 අංක 516

DVF/RECT/162(11).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

ලුතිනන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) දේසිංහ පතිරගේ දයානන්ද හේමසිරි, ශ්‍රීලයුපොදුසේබ (නි/5991)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-454

---

2007 අංක 517

DVF/RECT/260.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

ලුතිනන් (උපකරණ පාලක) (පොදු රාජකාරී) වන්නිහාමිගේ කරුණාරත්න ගරෙ (නි/5988)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-462/2

---

2007 අංක 518

DVF/RECT/22(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් රාජපක්ෂ මුදියන්සේලාගේ කුඩාබණ්ඩා, ශ්‍රීලංසිරෙ (නි/5140)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව නීතිය,
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-457

---

2007 අංක 519

DVF/RECT/262(III)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

ලුතිනන් ගෝනියා මාලිගමගේ ලක්ෂමන් අපොන්සු, ශ්‍රීලකාභ (නි/4780)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-455

2007 අංක 520

DIVF/RECT/54/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2007 අප්‍රේල් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා රයිෆල් බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කෙඩෙට් නිලධාරී වීරසිංහ මුදියන්සේලාගේ උපුල් නිෂාන්ද වීරසිංහ (සී/31822)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

12-460

2007 අංක 515

DVF/RECT/9AY(1).

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරිණිය 2007 ජනවාරි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් වීරසූරිය මුදියන්සේලාගේ මුදිතා කුසුම් වීරසූරිය, ශ්‍රීලයුකාබ (නි/5535)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

12-459/3

# ආණ්ඩුවේ නිවේදන

## වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දෙ ඇල ව්‍යාපාරයේ මහ කන්න රුස්වීම 2007/2008 මහ කන්න රුස්වීම් වාර්තාව

කන්දෙ ඇල ව්‍යාපාර අධිකාරී කාර්යාලයේ දී 2007.11.01 දින පවත්වන ලද කන්න රුස්වීමේදී පහත තීරණ ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | ඇල පොලු කැපීම | : | 2007.10.30 ට පෙර |
| 2. | පළමු ජල මුරට නිකුත් කිරීම | : | 2007.11.30 ට පෙර |
| 3. | වී තවාන් දැමීම | : | 2007.11.15 සිට 2007.11.25 දක්වා |
| 4. | සී සෑම ආරම්භ කිරීම | : | 2007.11.20 සිට 2007.12.10 දක්වා කළ යුතුය. |
| 5. | ගොයම් පැල සිටුවීම | : | 2007.12.20 ට පෙර කළ යුතුය |
| 6. | ජලය නිකුත් කරන අවසාන දිනය | : | 2008.05.30 |
| 7. | අස්වැන්න නෙලීම | : | 2008.05.30 |

මෙම වගා කාල සටහන ගොවි සංවිධාන බල ප්‍රදේශ අනුව පහත ආකාරයට වෙනස්කම් සිදු කෙරේ.

| *ගොවි සංවිධාන ක්‍රියාකාරකම* | *කොහිලගොල්ල ගොවි සංවිධානය* | *දියුරුම්වෙල ගොවි සංවිධානය* | *පුරංවෙල ගොවි සංවිධානය* | *අළුත් ඇල ගොවි සංවිධානය* |
|---|---|---|---|---|
| ඇල පොලු කැපීම | 2007.12.01 සිට 2007.12.05 | 2007.10.28 | 2007.11.15 සිට 2007.11.25 | 2007.12.01 සිට 2007.12.10 |
| පළමු ජල මුරය නිකුත් කිරීම | 2007.12.01 | 2007.11.10 | 2007.12.01 | 2007.12.15 |
| වී තවාන් දැමීම | 2007.12.05 සිට 2007.12.15 | 2007.11.15 සිට 2007.11.25 | 2007.12.05 සිට 2007.12.15 | |
| සී සෑම | 2007.12.15 සිට 2008.01.05 | 2007.11.20 සිට 2007.12.10 | 2007.12.20 සිට 2008.01.05 | 2007.12.16 සිට 2007.12.26 |
| පැල සිටුවීම | 2007.12.25 සිට 2008.01.10 | 2007.12.10 සිට 2007.12.20 | 2008.01.01 සිට 2008.01.10 | 2007.12.20 සිට 2007.12.30 |

| *ගොවි සංවිධාන ක්‍රියාකාරකම* | *කොහිලගොල්ල ගොවි සංවිධානය* | *දිවුරුම්වෙල ගොවි සංවිධානය* | *පුරංවෙල ගොවි සංවිධානය* | *අළුත් ඇල ගොවි සංවිධානය* |
|---|---|---|---|---|
| ජලය නිකුත් කිරීමේ අවසාන දිනය | 2008.05.25 | 2008.05.20 | 2008.05.30 | 2008.06.15 |
| අස්වැන්න නෙලීම | 2008.05.20 සිට 2008.06.05 | 2008.05.10 | 2008.05.20 | 2008.04.28 |

**කන්න වගා සැලැස්ම**

| *අනු අංකය* | *ගොවි සංවිධානය* | *මුළු අක්කර ප්‍රමාණය* | *වී වගා කරන අක්කර ප්‍රමාණය* | *එළවළු වගා කරන අක්කර ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. | දිවුරුම්වෙල ගොවි සංවිධානය | 60 | 60 | - |
| 2. | පුරංවෙල ගොවි සංවිධානය | 29 | 25 | 04 |
| 3. | ගවරම්මාන ගොවි සංවිධානය | 120 | 105 | 15 |
| 4. | කොහිලගොල්ල ගොවි සංවිධානය | 100 | 98 | 02 |
| 5. | නුගතලාව ගොවි සංවිධානය | 55 | 40 | 15 |
| 6. | වැවදිගදෝව ගොවි සංවිධානය | 37 | 37 | - |
| 7. | අලුත් ඇල ගොවි සංවිධානය | 81 1/2 | 18 | 63 1/2 |

8. *ඇල වේලි ශුද්ධ නොකරන අයට දඩ මුදල් අය කිරීම* .- කන්දෙ ඇල ව්‍යාපාරයට අදාල සියළුම ගොවි සංවිධාන ව්‍යාපාරය තුල ඇල වේලි ශුද්ධ කිරීමට සහය නොදක්වන ගොවීන්ට වී පැලකට රු. 500 බැගින් දඩයක් අය කිරීමට තීරණය විය.

9. *ගවයන්ගෙන් සිදුවන හානි සඳහා දඩ මුදල් අය කිරීම*.- ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර හා ගොවි සංවිධාන නියෝජිතයන් ගෙන් සැදුම් ලත් කමිටුවක් මගින් හානිය තක්සේරු කර දඩ මුදල අය කිරීමට තීරණය විය.

10. *නිර්දේශිත බිත්තර වී ලබා ගැනීම* .- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත බිත්තර වී වර්ගය බී. ජී. 403 හා ඒ. ටී. 402 බව කෘෂි කර්ම උපදේශක දන්වන ලදී.

ඩබ්. එම්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2007.11.23 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ දී ය.

12-428

---

**2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ**

34(2) (අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "බමුණු ආරච්චි පදනමේ හෝමාගම මූලික රෝහලේ ගොඩනැගිලි ඉදි කිරීමේ අරමුදල" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 නොවැම්බර් මස 29 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

*උපලේඛනය*

"බමුණු ආරච්චි පදනමේ හෝමාගම මූලික රෝහලේ ගොඩනැගිලි ඉදි කිරීමේ අරමුදල"

12-423

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

2006.12.31 දිනට ශේෂ පත්‍රය

(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත)

| | | *2005(රු)* | | *2006(රු)* | |
|---|---|---|---|---|---|
| වත්කම් | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| (අ) | ඉඩම් සහ ගොඩනැගිලි | 646,096,063 | | 730,468,998 | |
| (ආ) | කාර්යාල උපකරණ හා ලී බඩු | 250,593,334 | | 275,430,724 | |
| (ඇ) | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 19,973,722 | | 129,631,400 | |
| (ඈ) | ලී බඩු සහ සවිකිරීම් | 2,449,170 | | 2,022,462 | |
| (ඉ) | පුස්තකාල පොත් හා වාර සඟරා | 41,480,738 | | 47,803,306 | |
| (ඊ) | මෝටර් රථ | 19,017,100 | | 17,158,580 | |
| (උ) | උපාධි ලෝගු | 0 | | - | |
| (ඌ) | වෙනත් | 40,214 | | 90,830 | |
| (එ) | නව දුරකථන පද්ධතිය | 280,801 | 979,931,141 | 129,121 | 1,202,735,421 |
| | කෙරීගෙන යන වැඩ | | 187,797,980 | | 81,207,784 |
| | ආයෝජන | | 339,957,497 | | 366,887,070 |
| | ගර්භිත භාණ්ඩ අපහරණ ගිණුම | | 268,654 | | |
| ජංගම වත්කම් | | | | | |
| (අ) | බඩු තොග | 3,734,855 | | 4,089,524 | |
| (ආ) | විවිධ ණය ගැතියෝ | 20,896,330 | | 29,600,659 | |
| (ඇ) | සේවක ණය හා අත්තිකාරම් | 59,267,850 | | 77,280,193 | |
| (ඈ) | සැපයුම් සේවා ණය අත්තිකාරම් | 22,967,788 | | 19,917,908 | |
| (ඉ) | විවිධ අත්තිකාරම් | 12,189,557 | | 6,638,683 | |
| (ඊ) | විවිධ ආයතන හා විශ්ව විද්‍යාල වලින් ලැබිය යුතු මුදල් | 1,659,115 | | 821,601 | |
| (උ) | වෙනත් | 1,439,804 | | 756,602 | |
| (ඌ) | කලින් ගෙවීම් | 3,543,430 | | 923,075 | |
| (එ) | මුදල් සහ මුදල් හා සමනාදෘ | 30,560,754 | 156,259,483 | 23,038,183 | 163,066,429 |
| | මුළු වත්කම් | | 1,664,214,755 | | 1,813,896,704 |
| ප්‍රාග්ධනය | | | | | |
| (අ) | වැය වූ මූලධන ආධාර | 2,178,552,615 | | 1,413,265,226 | |
| (ආ) | වැය නොවූ මූලධන ආධාර | 74,229,416 | | (51,244,324) | |
| (ඇ) | ත්‍යාග හා පරිත්‍යාග | 44,020,725 | 2,296,802,756 | 49,882,410 | 1,411,903,311 |
| | සමුච්චිත අරමුදල් | | | | |
| | පොදු සංචිත | 18,958,102 | | 18,958,102 | |
| | ආදායම් සහ වියදම් ගිණුම | (1,325,176,435) | (1,306,218,333) | (504,045,458) | (485,087,356) |
| සංචිත හා නිශ්චිත අරමුදල් | | | | | |
| (අ) | විශේෂ සංචිත | 155,469,021 | | 218,425,416 | |
| (ආ) | ප්‍රධාන අරමුදල් | 35,076,732 | | 39,212,279 | |
| (ඇ) | පර්යේෂණ අරමුදල් | 130,546,860 | | 113,818,051 | |
| (ඈ) | බාහිර පාඨමාලා | 111,155,433 | | 121,836,929 | |
| (ඉ) | පරිත්‍යාග සහ ත්‍යාග | 31,214 | | 31,214 | |
| (ඊ) | වෙනත් | 11,948,569 | 444,227,828 | 8,687,167 | 502,011,055 |

| | 2005(රු) | | 2006(රු) | |
|---|---|---|---|---|
| ජංගම නොවන වගකීම් | | | | |
| පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | 184,154,445 | 184,154,445 | 313,582,175 | 313,582,175 |
| ජංගම වගකීම් | | | | |
| (අ) ගෙවිය යුතු වියදම් | 18,902,504 | | 28,278,087 | |
| (ආ) උපචිත වියදම් | 17,350,096 | | 32,404,422 | |
| (ඇ) ආපසු ගෙවිය යුතු තැන්පත් | 8,995,460 | 45,248,060 | 10,805,009 | 71,487,518 |
| මුළු වගකීම් | | 1,664,214,755 | | 1,813,896,703 |

පිළියෙල කළේ සහ සහතික කළේ : ආර්. පී. බණ්ඩාර, මුල්‍යාධිකාරි

එච්. ආර්. හුසේන්,
ලේඛකාධිකාරී.

මහාචාර්ය ටී. හෙට්ටිආරච්චි,
උපකුලපති.

## කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

### 2006.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

(වටිනාකම ආසන්න රුපියලට ගලපා ඇත)

| *ආදායම්* | *2005 (රු)* | | *2006(රු)* | |
|---|---|---|---|---|
| 01. රජයේ ආධාර | | | | |
| (අ) රජයේ ආධාර (පුනරාවර්ථන) | 615,000,000 | | 779,300,000 | |
| (ආ) රජයේ ආධාර වත්කම් ප්‍රතිසංස්කරණ නඩත්තු | 27,093,968 | | 43,936,432 | |
| (ඇ) ත්‍යාග සහ පරිත්‍යාග පුණරුත්ථාපන පුණරාවර්තන (ගොඩනැගිලි) | – | | 835,495 | |
| (ඇ) කල් ඉකුත් නොවූ ප්‍රාග්ධන ක්‍රමක්ෂ | – | | 8,764,627 | |
| (ඉ) ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂ | – | | 20,908,000 | |
| (ඇ) ශිෂ්‍යාධාර සඳහා ආධාර | 13,412,500 | | 11,664,850 | |
| (ඇ) මහපොළ ශිෂ්‍යධාර සඳහා ආධාර | | | | |
| (i) වි. වි. ප්‍ර. කො. සභාව | 8,134,350 | | 21,540,150 | |
| (ii) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර (ආදායම්) | 88,213,350 | | 108,224,300 | |
| (ඒ) හිඟ වැටුප් ගෙවීම සඳහා වි. වි. ප. කො. සභාවෙන් ආධාර | 8,525,000 | 760,379,168 | - | 995,173,854 |
| 02. ලියාපදිංචි ගාස්තු ප්‍රථම උපාධි | 1,160,608 | | 1,785,463 | |
| 03. ලියාපදිංචි ගාස්තු : පශ්චාත් උපාධි | 1,045,245 | | 926,500 | |
| 04. අධ්‍යයන ගාස්තු : ප්‍රථම උපාධි | 7,675,825 | | 7,916,828 | |
| 05. අධ්‍යයන ගාස්තු : පශ්චාත් උපාධි | 4,197,324 | | 1,674,250 | |
| 06. විභාග ගාස්තු : ප්‍රථම උපාධි | 105,124 | | 164,074 | |
| 07. විභාග ගාස්තු : පශ්චාත් උපාධි | 899,150 | | 489,800 | |
| 08. බාහිර විභාග නීති | 61,105 | | – | |
| 09. ණය පොළී | 2,229,322 | | 3,016,345 | |
| 10. ආයෝජන පොළී | 14,409,434 | | 19,512,266 | |
| 11. ප්‍රකාශන විකිණීම | 2,625 | | 2,500 | |
| 12. පරණ භාණ්ඩ විකිණීම | - | | 86,695 | |
| 12. දේපළ කුළී ආදායම් | 974,214 | | 1,263,926 | |
| 13. වෛද්‍ය ගාස්තු | 360,509 | | 306,790 | |
| 14. පුස්තකාල දඩ | 366,879 | | 599,024 | |
| 15. ව්‍යාපාරික කටයුතුවලින් | 696,420 | | 609,575 | |
| 16. සුළු මිශ්‍ර ආදායම් | 4,966,205 | | 24,774,470 | |
| 17. විදේශ විනිමය හුවමාරු ලාභය | 136 | | 695,203 | |
| 18. බාහිර සේවා සැපයීම් | 500 | | 1,98,200 | |
| වාහන විකිණීමේ ලාභ ගිණුම | 1,019,961 | – | | |
| 19. ගිවිසුම්කඩ කිරීමෙන් ආදායම | 5,173,269 | | 4,713,055 | |
| 20. ත්‍යාග හා පරිත්‍යාගවලින් ආදායම | 812,791 | | 766,829 | |
| 21. බාහිර පාඨමාලාවලින් ආදායම | 67,218,129 | | 77,457,144 | |

| *ආදායම්* | *2005 (රු)* | | *2006(රු)* | |
|---|---|---|---|---|
| 22. පර්යේෂණ ව්‍යාපෘති අරමුදලින් ලැබීම් | 97,826,450 | | 160,463,706 | |
| 23. ප්‍රදානයන් සඳහා ලැබීම් | 205,670 | 211,406,896 | 324,305 | 307,744,946 |
| | | 971,786,064 | | 1,302,918,801 |
| වියදම | | | | |
| පෞද්ගලික පඩිනඩි | | | | |
| වැටුප් හා වේතන | 297,249,009 | | 380,524,519 | |
| වි.අ.අ./සේ. හා.අ./විශ්‍රාම වැටුප් | 61,436,120 | | 92,939,562 | |
| දීමනා | 143,556,838 | | 164,173,424 | |
| අතිකාල/නිවාඩු දින ගෙවීම් | 10,959,598 | | 18,110,504 | |
| ගමන් වියදම් | 3,097,080 | | 3,012,130 | |
| සැපයීම් | 30,674,854 | | 44,563,094 | |
| නඩත්තු | 9,299,000 | | 13,132,801 | |
| කොන්ත්‍රාත්තුමය සේවා | 94,593,176 | | 119,027,590 | |
| වෙනත් | 22,122,317 | | 30,977,599 | |
| (i) මහපොළ ශිෂ්‍යත්ව වි. වි. ප්‍ර. කො. සභාව | 16,351,550 | | 21,517,000 | |
| (ii) මහපොළ ශිෂ්‍යාධාර සඳහා ආධාර (වියදම) | 78,661,150 | | 106,177,050 | |
| ශිෂ්‍යාධාර | 16,824,490 | | 11,488,325 | |
| ක්ෂය කිරීම් | 114,343,514 | | 121,942,588 | |
| පාරිතෝෂික දීමනා | 50,903,601 | | 147,416,726 | |
| බාහිර පාඨමාලා වියදම | 67,218,129 | | 77,457,144 | |
| පර්යේෂණ වියදම් | 97,826,450 | | 160,463,706 | |
| ප්‍රදානයන් | 205,670 | | 324,305 | |
| ප්‍රදානයන්ගෙන් ශිෂ්‍යත්ව ගෙවීම් | 30,000 | | 32,250 | |
| 101-2601- ගොඩනැගිලි (පුණරාවර්තන) | 27,093,968 | 1,142,446,513 | 44,771,927 | 1,558,052,244 |
| ආදායමට වඩා වැඩි වියදම් ඉදිරියට ගෙනාවා | | (170,660,450) | | (255,133,443) |

ආදායම් සහ වියදම් විසර්ජන ගිණුම

| | | |
|---|---|---|
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | | |
| ඉදිරියට ගෙනාවා | (170,660,450) | (255,133,443) |
| ආදායම් වියදම් ගිණුමේ ශේෂය | (1,190,019,640) | (1,325,176,435) |
| පසුගිය වර්ෂයේ ගැලපීම් | 35,503,655 | 1,076,264,420 |
| ශේෂය ශේෂ පත්‍රයට ගෙන ගියා | (1,325,176,435) | (504,045,458) |

**2007.12.31 දින අවසානයට කොළඹ විශ්වවිද්‍යාලයේ මුදල් ප්‍රකාශ සඳහා වූ සටහන්**

01 ගිණුම් ප්‍රතිපත්ති

01.01 **පොදු ප්‍රතිපත්ති**

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය මත හා ශ්‍රීලංකාවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනය සාධක කිසිත් ගැලපුම් කර නොමැති අතර ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ඉකුත් වර්ෂය සඳහා අදාළ සංඛ්‍යා හා යෙදීම් තත්කාලීන වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලදී.

01-02 **වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම**

01.02.01 **ඉඩම් හා ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම්**

පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර පෙන්වා ඇත. වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ජීවිත කාලය මත පදනම් වූ පහත සඳහන් ක්ෂය ප්‍රතිශත අනුව වාර්ෂිකව ලියා හරින ලද ක්ෂය වටිනාකම්, ආදායම් ප්‍රකාශයේ පෙන්වා ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලීබඩු සහ කාර්යාලීය උපකරණ | 10% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |

| | |
|---|---|
| ඇඳීම් හා සවිකිරීම් | 10% |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 20% |
| වාහන | 20% |
| උපාධි ලෝගු | 20% |
| වෙනත් වත්කම් | 10% |

මිළදී ගත් වර්ෂයේදී ක්ෂයවීම් ගණන් තබා නැත. ඉවත් කරන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂයවීම් ගණන් තබා ඇත.

01.02.02 *සේරම් නේවාසිකාගාරය කඩා ඉවත් කිරීම*

ගොඩනැගිල්ල ගරා වැටුණු තත්වයක තිබූ නිසාත් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීමටත් ශිෂ්‍යයන්ට වැඩියෙන් නේවාසික පහසුකම් ඇති කළ යුතු නිසාත් සේරම් නේවාසිකාගාරය වර්ෂය තුළදී කඩා ඉවත් කරන ලදී. සුන්බුන්වලින් රු. 490,000 ක මුදලක් ලැබුණි. ක්ෂයවීම් සහ ගොඩනැගිල්ලේ ප්‍රාග්ධන වටිනාකම් ගැලපීමෙන් පසු රු. 8,764,626.82 ක ශුද්ධ වටිනාකම වර්ෂයේ ආදායම ලෙස පෙන්වා ඇත.

01.02.03 *ගබඩා අත්තිකාරම්*

පිරිවැයට අගය කරන ලද බඩු තොග ගබඩා අත්තිකාරම් වේ. තොග ඇගයීම් පළමුව ලැබීම් පළමුව නිකුත් කිරීමේ ක්‍රමයට ආගණනය කර ඇත.

01.03 *මූලධන ප්‍රතිපාදන ගිණුම් තැබීම*

වර්ෂය තුල ලැබී ඇති මුළු මූලධන ප්‍රතිපාදන මිලියන 161.01 ක මුදල පහත සඳහන් ආකාරයට ප්‍රයෝජනයට ගෙන ඇත.

| | *රු. ශ.* |
|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් | 46,000 |
| පොත් මිලදී ගැනීම | 19,131 |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 51,945 |
| ලීබඩු සහ වෙනත් | 43,934 |

වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති මූලධන ප්‍රතිපාදන ප්‍රාග්ධන ගත කර සහ වත්කමේ ජීවිත කාලයට අනුව ක්‍රමක්ෂය කර ඇත. පසුගිය වර්ෂයේ ප්‍රාග්ධන ක්‍රමක්ෂය පැවැත්ම සඳහා රු. 1,049,025,092 ක් පොදු සංචිතයට මාරු කර ඇත. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර සහතික කරන ලද එහෙත් භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් නොකළ ඉදිකිරීම් කටයුතු සඳහා සහ විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සඳහා අභ්‍යන්තරව උපයා ගන්නා ලද බාහිර අරමුදල තාවකාලිකව ප්‍රයෝජනයට ගෙන ඇත

01. 04 *සේවක සුභසාධනය*

විශ්‍රාම පාරිතෝෂික පිරිවැය ගණුම්කරණය ප්‍රතිපත්ති 16 අනුව සේවයට බැඳුන මුල් වර්ෂයේ සිට සියළුම සේවකයින්ට වෙන් කරනු ලැබේ. කෙසේ නමුත් 1983 පාරිතෝෂික දීමනා පනතේ 12 වැනි වගන්තියට අනුව විශ්‍රාම පාරිතෝෂිකය හිමිවන්නේ සේවා කාලයක් අවුරුදු පහක් සම්පූර්ණ කරනු ලැබූ සේවයකුට ය. මෙම වෙන් කිරීම සඳහා බාහිර අරමුදලක් නොමැති අතර ආගණනයක් ද නොවේ.

01-04-02 *දායකත්ව සැලසුම් විග්‍රහය*

අර්ථසාධක අරමුදල් සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා බැඳීම ආදායම් ප්‍රකාශයේ දරන ලද වියදමක් ලෙස ප්‍රතිසංවිධානය කර ඇත.

01-04-03 *නඩු සඳහා වියදම් දැරීම*

පසුගිය වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර නොමැති නිසා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් අනුව සේවකයකුට ගෙවන ලද රු. 3,738,079.56 ක මුදල පෞද්ගලික පඩිනඩිවල ඇතුලත් කර ඇත.

01-05 *ජංගම බැරකම්*

01-05-01 ඉල්ලුම් කරන ලද අවස්ථාවේ දී ගෙවීමට නොහැකි වූ හෝ ශේෂ පත්‍ර දිනයේ සිට අවුරුද්දක් ඇතුළත ගෙවීමට අසමත් ඒවා ජංගම බැරකම් වේ.

01-05-02 *බදු ගෙවීම්*

දේශීය ආදායම් පනත අනුව විශ්වවිද්‍යාලය ආදායම් බදු නොගෙවයි. කෙසේ නමුත් අනෙකුත් පුනරාවර්තන වියදයම් ඇතුලත් අභ්‍යන්තර උපයන ආදායමින් ආර්ථික සේවා ගාස්තු ගෙවනු ලැබේ.

01. ආදායම් සහ වියදම්

01.06.01 *ආදායම් හඳුනා ගැනීම*

(*අ*) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු ලැබීම් පදනම මත හා ආයෝජන පොළී ආදායම උපචිත පදනමක් මත ගණන් තබා ඇත.
(*ආ*) විශේෂ අරමුදල් සහ ප්‍රදානයන්ගෙන් ආදායම ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති 29(25) අනුව ගණන් තබා ඇත. සාමාන්‍යයෙන් මෙය වර්ෂයේ අදාල අරමුදල් වලින් දරන ලද වියදමට සමාන වේ.

01.07 ලැබිය යුතු මුදල්

2006.12.31 දිනට රු. 36,837,282.09 ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් සේවකයින්ගෙන් අය විය යුතුව ඇත.

උපකුලපති
කොළඹ විශ්ව විද්‍යාලය

**කොළඹ විශ්ව විද්‍යාලයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්ව විද්‍යාලයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

1.2 විගණන විෂය පථය :

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම්, සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 *මතය*

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලය 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති සටහන් (අංක 2 -24 දක්වා) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම* :

2.2.1 *ගණකාධිකරණ අඩුපාඩු*

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු. 217,011,158 ක් වූ ගණකාධිකරණ අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. එයින් රු. 169,255,617 ක් වූ ගණකාධිකාරණ අඩුපාඩු නිවැරදි කර නැවත සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2007 මැයි මස 22 දින විගණනයට ඉදිරිපත් කෙරිණි.

2.2.2 *නොසැසඳු ගිණුම්*

ලෙජර ගිණුම් 30 ක ශේෂ වූ රු. 58,316,686 ක් ශේෂ පිරික්සුම හා නොසැසඳීම් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත යොමු කරන ලදී. එයින් රු. 57,482,142 ක් වූ ලෙජර් ගිණුම් 25 ක ශේෂ සැසඳීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරිණි.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් :*

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විද්‍යාල මන්දිරයේ සහ වෛද්‍ය පීඨයේ පරිගණක, ආපදා, සේවක හා වාහන ණය පිළිවෙලින් රු. 2,650,849 ක් හා රු. 753,652 ක් අය නොවී පැවතුණි.

(ආ) ශ්‍රී පාලි මණ්ඩපයට විවිධ ආයතන වලින් හා විශ්වවිද්‍යාල වලින් ලැබිය යුතු රු. 326,074 ක ශේෂ වර්ෂ 09 කට වඩා වැඩි කාලයක සිට පවතින අතර එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල මන්දිරයේ නොපියවූ විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 3, 351,329 ක් වූ අතර එයින් 68% ක් හෙවත් රු. 2,294,239 ක් වර්ෂ 10 ට වඩා පැරණි අත්තිකාරම් ශේෂ විය.

(ඈ) 2006 දෙසැම්බර් 31 දිනට විද්‍යාල මන්දිරයෙන් පුස්තකාල පොත් හා වාර සඟරා වෙනුවෙන් ලබාගත් නොපියවූ අත්තිකාරම් ප්‍රමාණය රු. 16,602,311 ක් වූ අතර එයින් රු. 288,473 ක ශේෂයන් වර්ෂ 10 කට වඩා පැරණි වේ.

(ඉ) 2006 දෙසැම්බර් 31 දිනට විද්‍යාල මන්දිරයේ නොපියවූ පරිභෝජ්‍ය අත්තිකාරම් ශේෂය රු. 146,038 ක් විය. එයින් 16% ක් වූ රු. 24,078 ක් වර්ෂ 03ක ට වඩා පැරණි අත්තිකාරම් ශේෂ විය.

(ඊ) 2006 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ නොපියවූ ප්‍රාග්ධන අත්තිකාරම් ශේෂය රු. 326,943 ක් වූ අතර එයින් රු. 158,456 ක් වර්ෂ 10 ට වඩා පැරණිය.

(උ) 2006 දෙසැම්බර් 31 දිනට ශ්‍රී පාලි මණ්ඩපයේ විවිධ ණය හිමි ශේෂය රු. 326,766 ක් වූ අතර එයින් 74% ක් වූ රු. 240,227 ක් වර්ෂ 05ක ට වඩා පැරණි වේ.

(ඌ) 2006 දෙසැම්බර් 31 දිනට ශ්‍රී පාලි මණ්ඩපයේ නොපියවූ ප්‍රාග්ධන අත්තිකාරම් ශේෂය රු. 175,588 ක් විය. එයින් රු. 413,067 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් වූ අතර 2006 දෙසැම්බර් 31 දිනට රු. 316,662 ක බැර ශේෂයක් ද විය.

(එ) 2006 දෙසැම්බර් 31 දිනට ශ්‍රී පාලි මණ්ඩලපයේ නොපියවූ විවිධ අත්තිකාරම් ශේෂය රු. 283,068 ක් වූ අතර එයින් 14% ක් වූ රු. 38,500 ක් වර්ෂ 06 කට වඩා පැරණිය.

(ඒ) 2006 දෙසැම්බර් 31 දිනට විද්‍යාල මන්දිරයේ නොපියවූ පර්යේෂණ අත්තිකාරම් ශේෂය රු. 213,730 ක් වූ අතර එයින් 67% ක් වූ රු. 143,730 ක් වර්ෂ 07 කට වඩා පැරණිය.

(ඔ) පර්යේෂණ කළමනාකරණ ඒකකයෙහි 2006 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු. 997,999 ක් වූ අතර ඉන් රු. 106,054 ක් වර්ෂයකට වඩා පැරණි ශේෂ විය. මානව හිමිකම් සංවර්ධන කේන්ද්‍රයෙහි අය නොවූ අත්තිකාරම් ශේෂය රු. 344,436 ක් හා ජයිකා අංශයෙහි අය නොවූ අත්තිකාරම් ශේෂය රු. 361,785 ක් ද විය.

(ඕ) 2006 දෙසැම්බර් මස 31 දිනට කොළඹ විශ්ව විද්‍යාලයේ ණයගැති ශේෂය රු. 14,657,549ක් වූ අතර එයින් රු. 1,20,182ක් වර්ෂ 04කට වඩා පැරණි ඒවා විය. 2006 දෙසැම්බර් මස 31 දිනට ණය ගැතියන්ගේ රු. 3,222,100ක බැර ශේෂයක් ද විය.

(ක) 2006 දෙසැම්බර් මස 31 දිනට විද්‍යාල මන්දිරයේ සුළු මුදල් අග්‍රිම ගිණුමේ ශේෂය රු. 390,813ක් ව පැවති අතර එදිනට එම ශේෂයන් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ග) 2006 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී පාලි මණ්ඩපයේ රඳවා ගැනීම් රු. 342,738ක් වූ අතර රු. 86,670ක් වර්ෂ පහකට වඩා පැරණි ශේෂයන් විය.

(ච) 2006 දෙසැම්බර් මස 31 දිනට විද්‍යාල මන්දිරයේ හා ශ්‍රීපාලි මණ්ඩපයේ ණයහිමි ශේෂය රු. 3,85,948ක් වූ අතර එයින් රු. 59,182ක් වූ විද්‍යාල මන්දිරයේ ණයහිමි ශේෂය වර්ෂ තුනකට වඩා පැරණි ශේෂයක් විය.

(ජ) පර්යේෂණ හා කළමනාකරණ ඒකකයේ හා මානව හිමිකම් සංවර්ධන කේන්ද්‍රයේ 2006 දෙසැම්බර් මස 31 දිනට නොපියවූ සුළු මුදල් ශේෂය රු. 2,21,233ක් වූ අතර ඉන් 54%ක් වූ රු. 1,19,000ක් වර්ෂ 04කට වඩා පැරණි ශේෂයක් විය.

(ට) වෛද්‍ය පීඨයෙහි 2006 දෙසැම්බර් මස 31 දිනට නොපියවූ සුළු මුදල් අග්‍රිම ශේෂය රු. 66,838ක් වූ අතර එදිනට එම ශේෂයන් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) 2006 දෙසැම්බර් මස 31 දිනට වෛද්‍ය පීඨයෙහි නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 4,88,773ක් වූ අතර එයින් රු. 36,788ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන් විය.

(න) 2006 දෙසැම්බර් මස 31 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ව්‍යාපෘති 102 (උපකරණ) ගිණුමේ ශේෂය රු. 1,37,722,856ක් වූ අතර එයින් රු. 29,841,932ක් වර්ෂයකට වඩා පැරණි ශේෂයන් විය.

(ත) *ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල්*

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 33 ඡේදය ප්‍රකාරව ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් 46 දෙනෙකුගෙන් රු. 40,241,022ක් අයවිය යුතුව තිබුණු අතර ඉන් ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,022,262ක් නීති උපදෙස් මත ලියා හැරීමට යෝජිතව තිබුණි.

(ii) ආචාර්යවරු දෙදෙනෙකුගෙන් රු. 6,388,097ක් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාල ලියවිලි යොමුකර තිබුණි.

(iii) එසේම ආචාර්යවරුන් දොළොස් දෙනෙකුගෙන් අයවිය යුතු රු. 10,533,819ක් වෙනුවෙන් නඩු පවරා ඇති නමුත් වර්ෂ පහකටත් අධික කාලයක් අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතුණි.

(iv) ආචාර්යවරුන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 8,193,932ක් ඔවුන්ගේ සේවක ආර්ථසාධක සහ පාරිතෝෂික මුදලින් අඩුකර ගැනීමට යෝජිතව වර්ෂ 05ක පමණ කාලයක් ඉක්මවා තිබුණ ද එම මුදල් අයකරගෙන නොතිබුණි. තව දුරටත් කල් පසු වීමෙන් කාලාවරෝධයට ලක්වීම මත ලැබිය යුතු එම මුදල් නොලැබී ලියා හැරීම සිදුවිය හැකි වීමේ අවදානමක් පවතින බවත් විගණනයට නිරීක්ෂණය විය.

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.6 ඡේදය ප්‍රකාරව ඇප බැඳුම්කරයට යටත්ව සිටින තැනැත්තන්ට ඔවුන් ගෙවීමට බැඳී ඇති සියලුම මුදල් ගෙවා දැමීම සම්බන්ධයෙන් දැන්වීමෙන් පසු නියමිත කාල සීමාව තුළදී පිළිතුරු නොලදහොත් ඒ මුදල් නියම කරන කාලසීමාවක් තුළදී ඇපකරුවන්ගෙන් හෝ ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවද ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන යොදා නොතිබුණි.

(vi) අධ්‍යයන නිවාඩු දීර්ඝ කරනු ලබන කාලපරිච්ඡේදය වෙනුවෙන් ඇප බැඳුම්කරය සංශෝධනය කිරීම කිසිදු ආචාර්යවරයෙකු සම්බන්ධයෙන් කර නොතිබුණි.

(vii) ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල් ලැබීම් පිළිබඳව ආයතන අංශයේ පවත්වාගෙන යනු ලබන උපලේඛන සමග ලෙජර් ගිණුම් සසඳා නොතිබුණු අතර 2005 වර්ෂයේ දී රු. 3,674,461ක වෙනසක් ද, 2006 වර්ෂයේ දී රු. 5,304,332ක වෙනසක් ද අනාවරණය විය.

2.2.4 *විගණනය සඳහා සාක්ෂි නොවීම* :

වෛද්‍ය පීඨයෙහි රු. 1,31,645ක් වූ අත්තිකාරම් ශේෂය වෙනුවෙන් උපලේඛන ඉදිරිපත් නොකෙරිණි.

2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :

නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| *නීති රීති, රෙගුලාසි ආදියට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|
| (*අ*) 2003 ජනවාරි මස 03 දින හා අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 4 හා 5 ඡේද. | පාවිච්චි කළ නොහැකි භාණ්ඩ අපහරණයට කටයුතු කර නොතිබුණි. |
| (*ආ*) 2002 නොවැම්බර් 28 දින හා අංක අයිඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක උපාංග මිල දී ගැනීමේ දී සැපයුම්කරු ලවා සම්පූර්ණ කරගත යුතු ආකෘති සම්පූර්ණ කරගෙන නොතිබුණ අතර ඊට අනුකූලව පරිගනක උපාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට පියවර ගෙන නොතිබුණි. |
| (*ඇ*) රජයේ මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (*ඈ*) රජයේ මුදල් රෙගුලාසි 373 | පර්යේෂණ හා කළමනාකරණ ඒකකය වෙත 2006 වර්ෂය හා ඊට පෙර ලබාගෙන තිබුණු එහෙත් 2006 දෙසැම්බර් මස 31 දිනට නොපියවූ සුළු මුදල් අග්‍රිම ශේෂය රු. 1,34,000ක් විය. |

2.2.6 *ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු* :

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරි දීමනා වශයෙන් 2006 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 1,783,937ක් ද, අධ්‍යයන දීමනා සාවද්‍ය ලෙස වැටුපට එකතු කර ගණනය කිරීම නිසා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට රු. 9,559,398ක් වැඩිපුර ගෙවීමක්ද සිදු කර තිබුණි.

ඉහත සඳහන් පරිදි වැටුප් හා දීමනා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාල කරගත නොහැකි බව රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවධාරණය කර තිබුණු අතර, ඊට අතිරේකව සිදුකර ඇති වැඩිපුර ගෙවීම් වැරදි සහගත බවත් ගෙවූ මුදල් නැවත අයකර ගැනීමටත් උපදෙස් දෙමින් මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති අමතමින් දී තිබුණු උපදෙස් ද සැලකිල්ලට නොගෙන එම ගෙවීම් අඛණ්ඩව සිදුකරමින් තිබුණි.

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය සමාලෝචනය* :

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු. 10,78,369,875ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු. 812,754,417ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු. 823,236,432ක් වූ රජයේ දායකය හේතුකොට ගෙන වර්ෂය සඳහා ඌනතාවය රු. 2,55,133,443ක් දක්වා අඩු වූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම සඳහා රු. 6,42,093,968ක් රජයේ දායකය හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු. 1,70,660,449ක් දක්වා අඩු විය.

3.1.2 *විශේෂිත අරමුදල් උපයෝජනය* :

විශ්ව විද්‍යාලය විසින් විශේෂිත සංචිත අරමුදල් 132ක් මෙහෙයවා තිබුණු අතර එම අරමුදල් හි 2006, දෙසැම්බර් මස 31 දිනට පිළිවෙලින් රු. 2,18,425,416ක ධන ශේෂයක් සහ රු. 1,278,276ක සෘණ ශේෂයක් විය. එකී අරමුදල්වල පවත්නා ශේෂයන් ඉක්මවා විශ්වවිද්‍යාලය විසින් වියදම් දරා තිබීම නිසා සෘණ ශේෂයක් උද්ගත වී තිබෙන අතර අරමුදල් 35ක් ඉකුත් වර්ෂ 6 තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 *අත්තිකාරම් පාලනය* :

පහත සඳහන් නිරීක්ණයන් කරනු ලැබේ :

(අ) අවස්ථා 07කදී ලබාගත් එකතුව රු. 4,77,850ක් වූ අත්තිකාරම් මුදල් අදාළ කාර්යය සඳහා වැය නොකර දින 07 සිට දින 95 දක්වා වූ කාල පමාවකින් පසුව ආපසු භාර දී තිබුණි.

(ආ) වැඩමුළු/වැඩ සටහන් පැවැත්වීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් අදාළ කාර්යය ඉටු කිරීමට දින 04 සිට දින 23 දක්වා කාල පරාසයට අයත් දින ගණනකට කලින් ලබාගෙන තිබුණ අතර නියැදි පරීක්ෂණයේ දී එසේ හෙළිදරව් වූ වටිනාකම රු. 659,050ක් විය.

(ඇ) අත්තිකාරම් ලේඛන පවත්වාගෙන යාමේ දී අනිවාර්යයෙන් සටහන් කළයුතු තොරතුරු සටහන් කර නොතිබුණි.

(ඈ) අත්තිකාරම් නොපියවා තිබියදීත් නිලධාරීන් 07 දෙනෙකුට නැවත නැවතත් අත්තිකාරම් ලබා දී තිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 *අධ්‍යයන කාර්ය සාධනය* :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ :

(අ) 2006 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2,034ක් අතර මෙම උපාධි අපේක්ෂකයන්ගේ සංයුතිය කලා අංශයෙන් 668ක් හෙවත් 33%ක් ද, නීති අංශයෙන් 210ක් හෙවත 10%ක් ද, කළමනාකරණ අංශයෙන් 393ක් හෙවත් 19%ක් ද, විද්‍යා අංශයෙන් 482ක් හෙවත් 24%ක් ද, වෛද්‍ය අංශයෙන් 220ක් හෙවත් 11%ක් ද, ශ්‍රී පාලි මණ්ඩපයට 61ක් හෙවත් 3%ක් ද වශයෙන් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 766ක් වූ අතර මෙම උපාධි අපේක්ෂකයන්ගේ සංයුතිය නීති අංශයෙන් 191ක් ද, විද්‍යා අංශයෙන් 290ක් ද, වෛද්‍ය අංශයෙන් 183ක් ද, ජනමාධ්‍ය හා ප්‍රසාංගික කලා 102ක් ද, වශයෙනේ විය. කලා, අධ්‍යාපන හා කළමණාකරණ සිසුන් කිසිවෙක් මෙම වර්ෂය තුළදී උපාධි ලබා බැහැරව නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ 2005 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 8,770ක් හා 2006 වර්ෂයේ දි 8,563ක් වූ අතර එය 207ක අඩුවීමක් විය. එම ශිෂ්‍ය සංඛ්‍යාව අධ්‍යාපන පීඨය 284ක්, නීති පීඨය 610ක්, විද්‍යා පීඨය 1,383, කලා පීඨය 3,081ක් වාණිජ හා කළමනාකරණ පීඨය 1,566ක්, වෛද්‍ය පීඨය, 1,413ක් හා ශ්‍රී පාලි මණ්ඩපය 226ක් වශයෙන් පීඨ අතර බෙදී ගොස් තිබුණි. 2005 වර්ෂයේ දැරූ මුළු ශිෂ්‍ය පුනරාවර්තන පිරිවැය රු. 6,93,858,072 ක් වූ අතර 2006 වර්ෂයේ දී රු. 8,81,772,788ක් විය. මේ අනුව 2005 වර්ෂයේ එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් රු. 79,117ක පුවරාවර්ථන පිරිවැයක් දරා තිබුණු අතර 2006 වර්ෂයේදී රු. 1,02,975ක් වූ අතර එය 30%ක වැඩිවීමක් විය. එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් දරන ලද සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය පීඨ වශයෙන් ශාස්ත්‍ර පීඨයෙහි රු. 75,971ක් ද, අධ්‍යාපන පීඨයෙහි රු. 1,27,004ක් ද, විද්‍යා පීඨයෙහි රු. 1,44,739ක් ද, නීති පීඨයෙහි රු. 75,035ක් ද, වෛද්‍ය පීඨයෙහි රු .163,364ක් ද, කළමනාකරණ පීඨයෙහි රු. 59,011ක් ද, ශ්‍රී පාලි මණ්ඩපයෙහි රු. 187,827ක් ද විය.

3.2.2 *පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම* :

(අ) උපාධි අධ්‍යයන පීඨයෙහි පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 2005/2006 වර්ෂයෙහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛයාව 392ක් වූ අතර පාඨමාලා ආදායම රු. 21,369,541ක් විය. සමාලෝචිත වර්ෂයෙහි පැවැත්වීමට නියමිතව තිබුණු අධ්‍යයන පාඨමාලා 11ක් සඳහා විභාග හා පර්යේෂණ නිබන්ධන පරීක්ෂා කිරීම් සිදු කර තිබුණි. සාමාලෝචිත වර්ෂයේ දී උපාධි ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 145ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී පශ්චාත් උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව 215ක් වූ අතර එය කලා පීඨය 38ක්, අධ්‍යාපන පීඨය 41ක්, කළමණාකරණ හා මූල්‍ය පීඨය 21ක්, වෛද්‍ය පීඨය 62ක්, විද්‍යා පීඨය 30ක්, උපාධි අධ්‍යයන පීඨය 23ක් ද වශයෙන් විය.

3.2.3 *සම්පත් දායකයන්* :

(අ) 2006 දෙසැම්බර් මස 31 දිනට විශ්වවිද්‍යාලයේ ස්ථිර කථිකාචාර්ය මණ්ඩලය 454ක්. එයින් 120ක් ශාස්ත්‍ර පීඨය සඳහා ද, 28ක් අධ්‍යාපන පීඨය සඳහා ද, 28ක් නීති පීඨය සඳහා ද. 50ක් වාණිජ හා කළමණාකරණ පීඨය සඳහා ද. 114ක් වෛද්‍ය පීඨය සඳහා ද, 97ක් විද්‍යා පීඨය සඳහා ද, 17ක් ශ්‍රී පාලි මණ්ඩපය සඳහා ද, විය. ඒ අනුව එක් එක් පීඨයෙහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සමඟ එක් එක් පීඨයෙහි කථිකාචාර්යවරු සංඛ්‍යාව සසඳන විට එක් කථිකාචාර්යවරයකුට ශාස්ත්‍ර පීඨයෙහි ශිෂ්‍යයන් 25ක් ද, අධ්‍යාපන පීඨයෙහි

ශිෂ්‍යයන් 10ක් ද, නීති පීඨයෙහි ශිෂ්‍යයන් 21ක් ද, වාණිජ හා කළමනාකරණ පීඨයෙහි ශිෂ්‍යන් 31ක් ද. වෛද්‍ය පීඨයෙහි ශිෂ්‍යයන් 12ක් ද, විද්‍යා පීඨයෙහි ශිෂ්‍යයන් 14ක් ද, හා ශ්‍රී පාලි මණ්ඩපයේ ශිෂ්‍යයන් 12ක් වශයෙන් විය. සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ ස්ථිර කථිකාචාර්ය මණ්ඩලයේ 454 දෙනාගෙන් 118ක් හෙවත් 26% ක් විවිධ හේතු මත නිවාඩු ලබා තිබුණි.

(ආ) 2006 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධිධාරීන්ගේ දේශන වෙනුවෙන් බාහිර කථිකාචාර්වාරවරුන් සඳහා වියදම රු. 7,140,999ක් වූ අතර එය ශාස්ත්‍ර පීඨය සඳහා 39%ක් ද, අධ්‍යාපන පීඨය, නීති පීඨය, හා කළමනාකරණ පීඨය සඳහා 11%ක් ද, විද්‍යා පීඨය සඳහා 10%ක් ද, ශ්‍රී පාලි මණ්ඩපය සඳහා 36%ක් ද, වෛද්‍ය පීඨය සඳහා 4%ක් ද, වශයෙන් බෙදී ගොස් තිබුණි.

3.2.4 *දේශන පැය* :

(අ) විගණනයට ලද තොරතුරු අනුව ප්‍රථම උපාධිධාරීන් වෙනුවෙන් අභ්‍යන්තර දේශන පැය 42,172ක් ද, බාහිර දේශන පැය 3,608.5ක් ද පවත්වා තිබුණි. අභ්‍යන්තර දේශන පැය විද්‍යා පීඨය 15,678ක්, වාණිජ හා කළමනාකරණ පීඨය 4,088ක්, අධ්‍යාපන පීඨය 2,149ක් වෛද්‍ය පීඨය 2,291ක් හා ශාස්ත්‍ර පීඨය 17,966ක් වශයෙන් විය. බාහිර දේශන පැය විද්‍යා පීඨය 660.5ක්, වාණිජ හා කළමණාකරණ පීඨය 358.5ක්, අධ්‍යාපන පීඨය 426ක්, වෛද්‍ය පීඨය 32ක් හා ශාස්ත්‍ර පීඨය 2,131.5ක් වශයෙන් විය. තවද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශන පැය 4,929ක් පවත්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල චක්‍රලේඛ අංක 32(8)(ඒ) අනුව ආධුනික කථිකාචාර්යවරයෙකු හා කථිකාචාර්යවරයෙකු සතියකට අවම වශයෙන් පැය 12ක කාලයක් උපාධි අපේක්ෂකයන්ට හට ඉගැන්වීම් කටයුතු කළ යුතු වුව ද ශාස්ත්‍ර පීඨයේ දේශකයින් 11ක් එසේ කර නොමැති බව අනාවරණය විය. ආවරණය කර නොතිබුණු දේශන පැය සංඛ්‍යාව 30ත් - 170ත් අතර විය.

(ඇ) විශ්වවිද්‍යාල චක්‍රලේඛ අංක 32(8)(බී) අනුව මහාචාර්යවරුන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සතියකට පැය 8ක කාලයක් දේශන කටයුතු වල නියැලිය යුතු වුවද දේශකයින් 12ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. ආවරණය කර නොතිබුණු දේශන පැය සංඛ්‍යාව 20ත් -128ත් අතර විය.

(ඈ) අනෙකුත් පීඨ විසින් අවශ්‍ය තොරතුරු සම්පූර්ණව ඉදිරිපත් නොකරන ලද බැවින් පවත්වන ලද දේශන පැය ගණන පිළිබඳ විගණන නිරීක්ෂණ කළ නොහැකි විය.

3.2.5 *විභාග පැවැත්වීම* :

සමාලෝචිත වර්ෂය තුළ පීඨ 06ක ප්‍රථම උපාධි විභාග 17ක් ද, පශ්චාත් ඩිප්ලෝමා විභාග 20ක් ද, පශ්චාත් උපාධි විභාග 22ක් ද, ආචාර්ය උපාධි විභාග 02ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 05ක් ද පවත්වා තිබුණි. මෙයින් ප්‍රථම උපාධි විභාග 06ක, පශ්චාත් ඩිප්ලෝමා විභාග 04ක, පශ්චාත් උපාධි විභාග 17ක, ආචාර්ය උපාධි 02ක හා වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 01ක ප්‍රතිඵල නිකුත් කර තිබුණි. ප්‍රතිඵල නිකුත් නොකරන ලද සමස්ත විභාග සංඛ්‍යාව 29ක් වූ අතර පාඨමාලා 03ක විභාග පවත්වාගෙන නොතිබුණි.

3.2.6 *මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ප්‍රදානය* :

සමාලෝචිත වර්ෂය තුළ දී මහපොළ ශිෂ්‍යත්ව 5,496ක් වෙනුවෙන් රු. 17,667,300ක් ද, ශිෂ්‍යයින් 692ක් වෙනුවෙන් ශිෂ්‍යාධාර වශයෙන් රු. 9,608,400ක් ප්‍රදානය කර තිබුණි.

3.2.7 *නේවාසිකාගාර පහසුකම් සැපයීම* :

සමාලෝචිත වර්ෂය තුළ නේවාසිකාගාර 12ක ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 2,602ක් සඳහා වර්ෂය තුළ දැරූ නේවාසිකාගාර වියදම රු. 42,766,046ක් වූ අතර එක් ශිෂ්‍යයකු වෙනුවෙන් දැරූ නේවාසිකාගාර වියදම රු. 16,436ක් විය. 2005 වර්ෂයේදී එම ප්‍රමාණය රු. 11,790ක් විය.

3.3 *කළමනාකරණ අකාර්යක්ෂමතා* :

(අ) වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා 2005 වර්ෂයේ දී පරිගණක 85ක් ස්ථානගත කිරීමට අවශ්‍ය ගොඩනැගිල්ල හා විදුලිය සැපයීම යන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමකින් තොරව මිළ දී ගැනීම් කර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගබඩා කාමරයක රඳවා තිබුණි. 2006 දෙසැම්බර් මස 31 වන විටත් පරිගණක කට්ටල 03ක් පෙට්ටියක බහා රඳවා තිබුණු අතර පරිගණක ජාල සැකසුම් පද්ධතිය සකස් කිරීම ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිමකර නොතිබුණි.

(ආ) පර්යේෂණ කළමණාකරණ ඒකකයේ මුදල් අයකිරීමේ පාඨමාලා ගිණුමක හා පර්යේෂණ ගිණුමක පිළිවෙලින් රු. 3,315,110ක් හා රු. 146,793ක් වශයෙන් ආදායමට වඩා වියදම් කර තිබුණි.

3.4 *වාර්ෂික වාර්තා* :

2003, 2004 හා 2005 වර්ෂයන්හි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

3.5 *හඳුනාගත් පාඩු* :

වාණිජ හා කළමනාකරණ පීඨය සඳහා 2005 පෙබරවාරි මස 21 දින මිල දී ගත් වටිනාකම රු. 477,000ක් වූ පරිගණක කට්ටලයන්හි ඇතුළත් පරිගණක මධ්‍යම සැකසුම් ඒකක 06ක් නැති වූ බව වාර්තා වී තිබුණි. සිදුවූ පාඩුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගණනය කර නොතිබුණි.

4. *පද්ධති හා පාලන* :

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු ය :

(අ) අත්තිකාරම් ;
(ආ) විදේශ ගමන් වියදම් ;
(ඇ) ලෙජර් සහ ජර්නල් සටහන් (උපාධි අධ්‍යයන පීඨය, වෛද්‍ය පීඨය, ශ්‍රී පාලි මණ්ඩපය) ;
(ඈ) පාරිතෝෂිත ගණනය (වෛද්‍ය පීඨය).

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

12-650

---

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කෙරේ.

1.2 *විගණන විෂය පථය* :

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේ දැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. ගිණුම්

2.1 *විගණන මතය* :

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් ඇති වන බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය ප්‍රකාශයන් හී දී ඇති සටහන්වල (සටහන් අංක ඒ සිට එෆ්) දක්වා ඇති පරිදි වූ, ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමඟින් 2005 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම :

2.2.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති

භාණ්ඩ සමීක්ෂණ වාර්තා පදනම් කරගෙන, තොග වටිනාකම ගිණුම්ගත කර ඇති බව මූල්‍ය ප්‍රකාශවල සටහන් මගින් දක්වා තිබුණ ද, විශ්ව විද්‍යාලයට අයත් කාර්යාල 120 ක 2005 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.2.2 *ගණකාධිකරණ අඩුපාඩු :*

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී, දරා ඇති ආරක්ෂක වියදම් ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම් වල දක්වා නොතිබුණු අතර, එම ආයතනවලින් අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අරමුදල් යටතේ ගිණුම්ගත කර තිබුණු ව්‍යාපෘති අටක, ආදායම් ඉක්මවා වියදම් දැරීමෙන් උද්ගත වී තිබුණු එකතුව රු. 1,874,566ක් වූ ඌනතාවය එවැනි ව්‍යාපෘතිවල අතිරික්තයට ගැලපීම නිසා, වෙනත් අරමුදල් යටතේ දක්වා තිබුණු ශුද්ධ ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කර තිබුණු ආචාර්යවරුන් 13 දෙනෙකුගෙන් අය විය යුතු රු. 2,339,205 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, රු. 122,790 ක් වූ ශේෂයක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2004 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂයන්හි එකතුව රු. 98,126,579 ක් වූ අතර, එය 2005 ජනවාරි 01 දින රු. 103,094,208 ක් ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් ගිණුම්වල රු. 4,967,629 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර හඳුනාගන්නා ලද රු. 76,597 ක් වූ සේවක ණය ශේෂ පහක් 2005 ජනවාරි 01 දිනට ගිණුම්වලින් අත් හැරී තිබුණි.

(ඉ) 2003 වර්ෂයේ දී අවස්ථා දෙකකදී තැන්පත් කර තිබුණු රු. 40,000 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහනයක් ආනයනය වෙනුවෙන් ගෙවන ලද රු. 1,421,982 ක් වාහන අලුත්වැඩියා වියදම් තුළ ඇතුළත් වී තිබුණි.

(උ) කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ගෙවන ලද රු. 30,000,000 ක අත්තිකාරම් පියවීම් කර නොතිබුණ ද, අනුචිත පරිදි කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2005 දෙසැම්බර් 31 දිනට පුස්තකාලවලට ලැබී තිබුණු රු. 1,378,930 ක් වූ විදේශීය වාර සඟරාවල වටිනාකම ප්‍රාග්ධනගත නොකර, මාර්ගස්ථ තොග ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(එ) මාර්ගස්ථ තොග ලෙස ගිණුම්ගත කර තිබුණු රු. 179,178 ක් වූ භාණ්ඩ අස්ථානගත වී තිබුණද, ගිණුම්වල අදාළ ගැලපීම් කර නොතිබුණි.

(ඒ) 2002 වර්ෂයේ දී උපකරණ මිල දී ගැනීම සඳහා ගෙවන ලද රු. 823,237 ක් සහ 2004 වර්ෂයේ දී වාහන මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු. 2,000,000ක් කෙරී ගෙන යන වැඩ ලෙස අනුචිත පරිදි ගිණුම්ගත කර තිබුණු අතර, 2005 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදිව ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඔ) දන්ත වෛද්‍ය පීඨ ගබඩාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු විෂයයන් 189 ක් යටතේ වූ ඒකක 1,853 ක වටිනාකම ගණනය කර, තොග ශේෂයට ඇතුළත් කර නොතිබුණි.

(ඕ) දන්ත වෛද්‍ය පීඨයේ පුහුණු පාඨමාලාවට අදාළ 2005 දෙසැම්බර් 31 දිනට රු. 13,958 ක් වූ අවසන් ලිපි ද්‍රව්‍ය තොග වටිනාකම දෙවරක් ගණන් ගැනීම හේතුවෙන්, ලිපි ද්‍රව්‍ය තොග වටිනාකම රු. 13,958 ක් වැඩියෙන් දැක්විණි.

(ක) පියවා තිබුණු රු. 77,585 ක ශේෂයක් සහ අවලංගු කරන ලද රු. 3,232 ක ශේෂයක් සැපයුම් අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත්ව තිබීම හේතුවෙන් එම ගිණුමේ ශේෂය රු. 80,817කින් වැඩියෙන් දැක්විණි.

(ග) 2006 වෙනුවෙන් 2005 වර්ෂය තුළ දි වාර සඟරා සඳහා ගෙවා තිබුණු රු. 224,090 ක් මාර්ගස්ථ තොග ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 *නොසැසඳූ පාලන ගිණුම් :*

පහත සඳහන් නොසැසඳූ ගිණුම් නිරීක්ෂණය විය.

(අ) ගිණුම්වල දැක්වෙන බාහිර විභාග අංශය වෙත ගෙවිය යුතු මුදල් ශේෂය සහ මූල්‍ය ප්‍රකාශයන්හි ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කර තිබුණු බාහිර විභාග අංශයේ ගිණුම්වල දැක්වෙන එම අංශයට ලැබිය යුතු ශේෂය අතර, රු. 9,191,915 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගිණුම්වල දැක්වෙන 2005 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු. 93,137,887 ක් වුවද, සේවක ණය ලේඛනයේ දැක්වෙන ශේෂවල එකතුව රු. 94,568,430 ක් වූයෙන් රු. 1,430,543ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම්වල දක්වා තිබුණු තැන්පත් ගිණුමේ ශේෂ තැන්පත් ලේඛනයේ ශේෂ සමහ සැසැඳීමේ දී රු. 931,025 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) උපලේඛන බී 11 මගින් ප්‍රාග්ධනගත කළ නිම කරන ලද වැඩවල වටිනාකමට රු. 21,274,878 ක් වූ කෙරී ගෙන යන වැඩවල වටිනාකම ද ඇතුළත්ව තිබුණි.

(ඉ) ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව, කෙරී ගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු. 21,002,862 ක් වූ අතර, විස්තරාත්මක උපලේඛනයේ එය රු. 21,274,879 ක් වූයෙන්, රු. 272,017 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්* :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අරමුදල් ශේෂ වශයෙන් ගිණුම්වල දක්වා තිබුණු රු. 4,363,408 ක් වූ ශේෂ 58 ක් වර්ෂ 02ත් වර්ෂ 07 ත් අතර කාලයක සිට පරිශේෂව පැවතුණි.

(ආ) ගිණුම්වල දක්වා තිබුණු රු. 3,264,155 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂ 84ක් වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාලයක සිට පරිශේෂව පැවතුණි.

(ඇ) එකතුව රු. 1,312,387 ක් වූ දේශීය සැපයුම් අත්තිකාරම් ශේෂය තුළ වර්ෂ 4කට වඩා පැරණි රු. 232,405ක් වූ ශේෂ 26ක් හා වර්ෂ 02කට වඩා පැරණි රු. 245,986 ක් වූ ශේෂ 30ක් පැවතිය ද, ඒවා පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දේශීය සැපයුම්, පර්යේෂණ හා අරමුදල් සහ වැය ශීර්ෂ ගත සේවා වෙනුවෙන් 1989 සිට 2004 වර්ෂය දක්වා ලබා දී තිබුණු පිළිවෙලින් රු. 1,312,386 ක්, රු. 1,916,735 ක් හා රු. 2,251,603 ක් වූ අත්තිකාරම් 2005 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ඉ) විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු ලේඛනය අනුව, 1988 සිට 2005 දක්වා කාල පරිච්ඡේදය තුළ ගිවිසුම් කඩ කරන ලද කථිකාචාර්යවරුන් 155 දෙනෙකුගෙන් රු. 90,157,789 ක් අයවිය යුතු වුවද, එම මුදල් අය කර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඊ) විවිධ ණය හිමියන් යටතේ නොගෙවූ වැටුප් වශයෙන් ගිණුම්වල ඇතුළත්ව තිබුණු රු. 3,421,871 ක් තුළ විදේශ ගත වී ගිවිසුම් කඩ කළ, ඉල්ලා අස් වූ හා සේවය අත හැර ගිය නිලධාරීන්ගේ වැටුප් ද තිබුණු නමුත්, එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(උ) බැංකු ගිණුම් 06කට අදාළව 2005 දෙසැම්බර් 31 දින තෙක් උපලබ්ධි නොවූ රු. 880,548 ක් වටිනා චෙක්පත් සම්බන්ධව ක්‍රියා කර නොතිබුණි.

2.2.5 *විගණනය සඳහා සාක්ෂි නොවීම* :

ගිණුම්වල දක්වා තිබුණු එකතුව රු. 2,071,176 ක් වූ කාර්යය මණ්ඩල ණය, එකතුව රු. 91,253 ක් වූ අත්තිකාරම්, එකතුව රු. 524,002 ක් වූ තැන්පතු සහ රු. 3,421,871 ක් වූ නොගෙවූ වැටුප්, උපයෝගී ලේඛන, වයස් විශ්ලේෂණ, සවිස්තරාත්මක උපලේඛන නොමැතිවීම හේතු කොට ගෙන, ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

2.2.6 *නීති, රීති, රෙගුලාසි සහ කළමණාකාරීත්ව තීරණයන්ට අනුකූල නොවීම* :

නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

| *නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම්* |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | ආයෝජනය කර තිබුණු රු. 19,000,000 ක් සහ ආපසු ලබා ගෙන තිබුණු රු. 9,830,650 ක් සඳහා අදාළ ඇමතිවරයාගේ අනුමැතිය සමහ මුදල් ඇමතිවරයාගේ එකහතාවය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 (1) වගන්තියේ-(අ), (ආ), (ඇ) සහ සහ (ඇ) යන උපවගන්ති | ලැබෙන සියලුම මුදල් “විශ්ව විද්‍යාල අරමුදල” යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට බැර කළ යුතු වුවත්, විශ්ව විද්‍යාලය වෙත ලැබී තිබුණු රු. 189,523,989 ක් එම අරමුදලට බැර කර නොතිබුණි. |
| (ඇ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 131 වගන්තිය | ඉංජිනේරු පීඨයේ නිශ්චිත ගෙවීම්වලින් රඳවා ගැනීමේ බදු වශයෙන් රු. 36,884 ක් අඩු කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) මුදල් රෙගුලාසි 71 හා 2003 ජුනි 02 දින හා පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.10 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ඉංජිනේරු නිර්මාණ හා සැළසුම් අංශයට බඳවා ගෙන තිබුණු ඉංජිනේරු උපදේශකවරයකුව 2005 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පාරිශ්‍රමිකය වශයෙන් රු. 405,000 ක් ගෙවා තිබුණි. |

| | *නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව* | *අනුකූල නොවීම්* |
|---|---|---|
| (ඉ) | මුදල් රෙගුලාසි 371 (ආ) | එක් අවස්ථාවක දිය හැකි අත්තිකාරම් මුදල රු. 20,000 ක් වුවත්, රු. 24,150 සිට රු. 269,290 ක් දක්වා අත්තිකාරම් ලබා දුන් අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කර මාස 06ක් කල් ඉකුත් වූ රු. 1,557,019 ක් වූ චෙක්පත් 106ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (උ) | මුදල් රෙගුලාසි 770 හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 04 ඡේදය | I.භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිර්දේශිත පරිදි පිරිවැය රු. 365,822 ක් වූ විෂයයන් 161ක් හා පිරිවැය ගණනය නොකරන ලද විෂයයන් 1,891ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | | II. ඉංජිනේරු පීඨයේ තොග ගබඩාවෙන් ඉවත් කර ලද රු. 26,418ක් වටිනාකමින් යුත් භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | මුදල් රෙගුලාසි 770 හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 03 ඡේදය | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, විෂයයන් 965ක ඌනතාවයන් හා අංක 03ට අදාළව විෂයයන් 57ක අතිරික්තයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. |
| (එ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 23.3.1, 23.3.3 හා 23.3.6 වගන්ති | විධිවිධාන වලට අනුකූල නොවන පරිදි විශ්ව විද්‍යාලයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුරට වැඩ බැලීමේ පත්වීමක් කර තිබුණි. |
| (ඒ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.3 වගන්තිය | දන්ත වෛද්‍ය පීඨයේ පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් නිලධාරීන්ට හා කථිකාචාර්යවරුන්ට අදාළ අනුමැතිය නොමැතිව රු. 172,750ක් ගෙවා තිබුණි. |
| (ඔ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 2.8 වගන්තිය | පීඨවල හා දෙපාර්තමේන්තුවල ඇති ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන නොකර, කාර්යාලවල ඇති ඉන්වෙන්ට්‍රි ලේඛන පදනම් කර ගෙන භාණ්ඩ සමීක්ෂණ සිදු කර තිබුණි. |
| (ඕ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහය XXVII පරිච්ඡේදයේ 2.1 වගන්තිය | 1998 වර්ෂයේ දී ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයෙන් ආධාර වශයෙන් ලැබී තිබුණු ට්‍රැක්ටර් 04ක් සහ ට්‍රේලරයක් 2005 සැප්තැම්බර් වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. |
| (ක) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ XXVII පරිච්ඡේදයේ 8 වගන්තිය | ඉන්ධන දහනය වන ප්‍රමාණය පිළිබඳව ඇගයීමක් කර ඒ අනුව, ධාවන සටහන් තුලනය කර නොතිබුණි. |

2.2.7 *ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු* :

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට සහ 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතට පටහැනිව නිකුත් කර තිබුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ප්‍රකාරව, හිලව් දීමනා හා අධ්‍යයන දීමනා පදනම් කර ගෙන සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් වශයෙන් පිළිවෙලින් රු. 94,254,636 ක් සහ රු. 18,850,924 ක් 1998 සිට 2005 දක්වා කාල පරිච්ඡේදය තුළ වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව භාෂා ප්‍රවීණතා දීමනා, වශයෙන් රු. 18,794,673ක් 1994 සිට 2005 දක්වා කාල පරිච්ඡේදය තුළ ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල මුදල් කාරක සභා තීරණයකට අනුව, දුරකථන බිල්පත් වෙනුවෙන් රජයේ වියදමින් ගෙවිය හැකි උපරිම සීමාව ඉක්මවා 2005 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා දුරකථන 10 ක් වෙනුවෙන් රු. 424,314 ක් වැය කර තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල මුදල් කාරක සභාවේ අනුමැතියක් ලබා නොගෙන, ලියාපදිංචිවීම ප්‍රමාදවීම වෙනුවෙන් එක් ශිෂ්‍යයකුගෙන් රු. 200 ක් ද, විෂයයන් වෙනස් කිරීම වෙනුවෙන් රු. 500 ක් ද, විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ අභිමතය පරිදි ශිෂ්‍යයින් 41 දෙනෙකුගෙන් රු. 10,000 ක දඩ මුදල් ද අය කර තිබුණි. මෙම මුදල් අය කිරීම වෙනුවෙන් මුදල් රෙගුලාසි 184 ප්‍රකාර කුවිතාන්සි නිකුත් කර නොතිබුණු අතර, 2005 දෙසැම්බර් 16 දින වන විටත්, මුදල් රෙගුලාසි 185 ප්‍රකාර එම මුදල් විශ්ව විද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි.

3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය ප්‍රතිඵල*

පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 521,875,858ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා රු. 429,971,231ක ඌනතාවයක් විය. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 91,904,627ක ශුද්ධ පිරිහීමක් නිරීක්ෂණය වූ අතර, කාර්ය මණ්ඩල පාරිශ්‍රමික, ගිවිසුම්ගත සේවා, අනෙකුත් මෙහෙයුම් සහ ක්ෂය ප්‍රතිපාදන වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 *කාර්යය සාධනය*

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බාහිර විභාග අංශයේ 2000 සිට 2004 දක්වා කාලය තුළ පැවැත්විය යුතු උපාධි පරීක්ෂණ 06ක් 2005 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වා නොතිබුණි. 2000 සිට 2004 දක්වා කාලය තුළ පැවැත්වූ උපාධි පාඨමාලා 10ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා දින 234 සිට 575 දක්වා වූ දීර්ඝ කාල ප්‍රමාදයන් තිබුණි.

(ආ) ඒ ඒ පීඨයන් හි අධ්‍යයන වර්ෂ හතරකට අදාළව විගණනය වෙත සපයන ලද තොරතුරු අනුව, අවසන් වසරේ විභාගය සඳහා පෙනී සිටින ලද ශිෂ්‍ය සංඛ්‍යාව, සමත් ශිෂ්‍ය සංඛ්‍යාව, ඌන හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව පෙනී සිටි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් පහත දක්වා ඇත.

| *පීඨය* | *වර්ෂය* | *පෙනී සිටි සංඛ්‍යාව* | *සමත් සංඛ්‍යාව* | *අසමත් හා ඌන සමත් සංඛ්‍යාව* | *සමත් සංඛ්‍යාව පෙනී සිටි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන්* | *අසමත්/ඌන සමත් සංඛ්‍යාව පෙනී සිටි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන්* |
|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍ර | 2002 | සා. 241 | 201 | 40 | 83.4 | 16.6 |
| | | වි. 325 | 323 | 02 | 99.4 | 0.6 |
| | 2003 | සා. 206 | 156 | 50 | 75.7 | 24.3 |
| | | වි. 354 | 350 | 04 | 98.9 | 1.1 |
| | 2004 | සා. 226 | 207 | 19 | 91.6 | 8.4 |
| | | වි. 441 | 422 | 19 | 95.7 | 4.3 |
| | 2005 | සා. 187 | සා. 149 | සා. 38 | 79.7 | 20.32 |
| | | වි. 370 | වි. 362 | වි. 08 | 97.8 | 2.2 |
| වෛද්‍ය | 2002 | 233 | 172 | 61 | 73.8 | 26.2 |
| | 2003 | 400 | 333 | 67 | 83.2 | 16.8 |
| | 2004 | 26 | 17 | 09 | 65.4 | 34.6 |
| | 2005 | 411 | 341 | 07 | 82.9 | 1.7 |
| කෘෂිකර්ම | 2002 | 186 | 186 | - | 100.0 | - |
| | 2003 | 194 | 191 | 03 | 98.4 | 1.6 |
| | 2004 | ** 377 | 372 | 05 | 98.7 | 1.3 |
| | 2005 | 188 | 166 | 22 | 88.3 | 11.7 |
| දන්ත වෛද්‍ය | 2002 | 77 | 45 | 32 | 58.4 | 41.6 |
| | 2003 | 74 | 57 | 17 | 77.0 | 23.0 |
| | 2004 | 83 | 52 | 31 | 62.6 | 37.4 |
| | 2005 | 73 | 67 | 06 | 91.8 | 8.2 |
| ඉංජිනේරු | 2002 | 494 | 259 | 235 | 52.4 | 47.6 |
| | 2003 | 494 | 279 | 215 | 56.5 | 43.5 |
| | 2004 | 513 | 284 | 229 | 55.4 | 44.6 |
| | 2005 | | තොරතුරු ඉදිරිපත් නොවුණි. | | | |
| විද්‍යා | 2002 | සා. 399 | 213 | 186 | 53.4 | 46.6 |
| | | වි. 73 | 72 | 01 | 98.6 | 1.4 |

| පීඨය | වර්ෂය | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | අසමත් හා ඌන සමත් සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව පෙනී සිටි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් | අසමත්/ඌන සමත් සංඛ්‍යාව පෙනී සිටි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|---|---|
| | 2003 | සා. 621 | 464 | 157 | 74.7 | 25.3 |
| | | වි. 73 | 73 | - | 100.0 | - |
| | 2004 | සා. 332 | 260 | 72 | 78.3 | 21.7 |
| | | වි. 107 | 106 | 01 | 99.1 | 0.9 |
| | 2005 | සා. 201 | 148 | 53 | 73.6 | 26.4 |
| | | වි. 88 | 88 | නැත | 100 | නැත |
| පශු වෛද්‍ය | 2002 | 60 | 55 | 03* | 91.7 | 5.0 |
| | 2003 | 61 | 55 | 06 | 90.2 | 9.8 |
| | 2004 | 64 | 34 | 30 | 53.1 | 46.9 |
| | 2005 | 139 | 129 | 05 | 92.8 | 3.6 |

* දෙදෙනෙකුගේ ප්‍රතිඵල අත්හිටුවා ඇත.

** එකවර කණ්ඩායම් දෙකක් බඳවා ගෙන ඇත.

(ඇ)විශ්ව විද්‍යාලයේ ඒ ඒ පීඨයන් යටතේ අනුමත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය, අධ්‍යයන නිවාඩු ලබා ගෙන ඇති සහ අධ්‍යයන කටයුතුවල යෙදුණු කථිකාචාර්යවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳව 2005 වර්ෂයට අදාළ විස්තරයක් පහත දැක්වේ.

| පීඨය | දෙපාර්තමේන්තු | තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | අතිරික්තය/ (ඌනතාවය) | අධ්‍යයන නිවාඩු සඳහා මුදා හැර ඇති සංඛ්‍යාව | දැනට සේවයේ නියුතු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පශු වෛද්‍ය | 04 | මහාචාර්ය | 06 | 05 | 01 | - | 05 |
| | | කථිකාචාර්ය | 36 | 24 | 12 | 08 | 24 |
| දන්ත වෛද්‍ය | 07 | මහාචාර්ය | 14 | 06 | 08 | - | 06 |
| | | කථිකාචාර්ය | 60 | 55 | 05 | 14 | 43 |
| කෘෂිකර්ම* | 09 | මහාචාර්ය | 19 | 26 | (07) | - | 19 |
| | | කථිකාචාර්ය | 95 | 78 | 17 | 13 | 95 |
| ඉංජිනේරු* | 08 | මහාචාර්ය | 10 | 03 | 07 | - | 03 |
| | | කථිකාචාර්ය | 104 | 57 | 47 | 04 | 53 |
| | | පර්. සහකාර | 02 | - | - | - | - |
| | | උපදේශක (තොර. තාක්ෂ) | 05 | 04 | 01 | - | 04 |
| | | ඉගැන්. සහකාර | 33 | 18 | 15 | - | 18 |
| | | තාවකා. උපදේ. | 25 | 17 | 18 | - | 17 |
| | | තාවකා. කථී. | - | 04 | 04 | - | 04 |
| ශාස්ත්‍ර | 16 | මහාචාර්ය | 41 | 39 | 02 | - | 36 |
| | | කථිකාචාර්ය | 161 | 142 | 19 | 30 | 119 |
| වෛද්‍ය | 17 | මහාචාර්ය | 24 | 24 | - } | } | |
| | | කථිකාචාර්ය | 111 | 111 | - } | 43 } | 93 |
| | | පර්. සහ තාව. | 01 | - | 01 | - | - |
| විද්‍යා | 09 | මහාචාර්ය | 27 | 30 | (03) | 06 | 23 |
| | | කථිකාචාර්ය | 90 | 82 | 08 | 19 | 63 |
| | | ඉගැන්. සහකාර | 27 | 27 | - | - | 22 |
| | | තාව. පර්. සහකාර | 02 | 04 | 02 | - | 03 |
| | | උපදේශක | 14 | 08 | - | 01 | 07 |

* අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා තාවකාලික කථිකාචාර්යවරුන් බඳවා ගෙන තිබුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය :

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදි කිරීම්වලට අදාළ රු. 94,696,119ක් පිරිවැය වූ කර්මාන්ත 36ට අදාළ ගිවිසුම් ප්‍රකාරව, 2000 සිට 2004 දක්වා වර්ෂවල දී වැඩ නිම කළ යුතු වුවත්, 2004 දෙසැම්බර් 31 දින වන විටත් රු. 45,124,289 ක කාර්යයන් ඉටු නොකර අත හැර දමා තිබුණි. එම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා 2005 වර්ෂය තුළ දී විධිමත් පියවර ගෙන නොතිබුණු අතර, ගිවිසුම් ප්‍රකාර කර්මාන්ත නිම නොකිරීම හා අඩු පාඩු සහිතව ඉටු කරන ලද වැඩ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව පියවර ගැනීම ද කර නොතිබුණි.

(ආ) නේවාසිකාගාර වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීමට අදාළ කර්මාන්ත 06ක් භෞතිකව පරීක්ෂා කිරීමේ දී, කොන්ත්‍රාත් මුදලෙන් 16% සිට 95% දක්වා විහිදී ගිය මුදල් ප්‍රමාණයක් ගෙවා තිබුණ ද, අදාළ අලුත්වැඩියාව ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූ පල්දෝරු පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කර නොතිබුණි.

(ඇ) ගිවිසුම් ප්‍රකාරව, 2004 අගෝස්තු 31 දින සිට 2005 අප්‍රේල් 28 දින දක්වා කාලය තුළ ආරම්භ කර 2005 නොවැම්බර් 05 දින වන විට වැඩ අවසන් කළයුතු වූ, ඇස්තමේන්තුගත වියදම රු. 57,662,341ක් වූ කර්මාන්ත 13ක් වෙනුවෙන් ඒ වන විට සහතික කර ගෙවා තිබූ මුදල රු. 26,182,612ක් විය.

(ඇ) සංඝමිත්තා ශාලාවේ වැසිකිළි 06ක් අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන් 05ක් යටතේ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වැඩියෙන් කර තිබුණ වැඩ සඳහා විධිමත් අනුමැතියක් නොමැතිව රු. 207,147ක් ගෙවා තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාල පුස්තකාල ජාලයේ සූචි පත්‍රවල වූ ග්‍රන්ථ විඥාත තොරතුරු මෘදුකාංග මගින් පරිගණකගත කිරීම සඳහා 2004 අගෝස්තු 10 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹී තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු අනෙකුත් සුදුසුකම් සපුරා තිබිය දී, ලංසු බැඳුම්කරය (Bid Bond) ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කර නොතිබීම හේතු කර ගෙන, ටෙන්ඩරය ඔහුට පිරිනමා නොතිබුණු අතර, දෙවන අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන්, විශ්ව විද්‍යාල අරමුදලට වූ පාඩුව රු. 249,901 ක් විය.

II. කොන්ත්‍රාත්තුව පවරන විට මෘදුකාංගගත කර තිබුණු දත්තවල දෝෂ නිවැරදි කිරීමේ සංස්කරණ කටයුතු එම කොන්ත්‍රාත්තුවටම ඇතුළත් නොකිරීම ප්‍රශ්නගත විය. සංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව බාහිර පාර්ශවයක් යොදා ගෙන තිබුණු අතර, එම කටයුතු සඳහා රු. 241,523 ක් ගෙවා තිබුණි. එම ගෙවීම සඳහා යොදා ගත් පදනම පැහැදිලි නොවිණි.

III. දත්ත පරිගණකගත කිරීම හා සංස්කරණය විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලය මගින් ඉටු කරවා ගැනීමට හා ඒ සඳහා විශ්ව විද්‍යාලයේ සිටින පරිගණක පිළිබඳ විශේෂඥ දැනුම ඇති නිලධාරීන්/ආචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අවධානය යොමු කර නොතිබුණි.

IV. දත්ත පරිගණකගත කිරීමට සහ සංස්කරණ කටයුතු සඳහා රු. 1,147,541ක් වැය කර තිබුණි. එහෙත්, අවශ්‍ය කරන නිවැරදි තොරතුරු 2006 පෙබරවාරි 14 දින වන විටත් ලබා ගත නොහැකිව තිබුණි.

3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා :

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආර්ථික අපහසුතා ඇති ශිෂ්‍යයින්ට හා ශිෂ්‍යාවන්ට, ශිෂ්‍යත්ව ලබා දීම සඳහා බාහිර පුද්ගලයින් විසින් විශ්වවිද්‍යාලයට මුදල් පිරිනමා තිබුණි. මෙම මුදල් ආයෝජනය කර, ලැබෙන පොළියෙන් 80%ක ප්‍රමාණයක් එම කාර්යය සඳහා යොදා ගැනීමට පාලක සභාව විසින් තීරණය කර තිබුණ ද, අරමුණුගත කාර්යය විධිමත්ව ඉටු කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසා නොතිබීමෙන්, ඉකුත් වර්ෂය සඳහා ලැබූ පොළියෙන් 33%ක් පමණක් ශිෂ්‍යයින්ට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා උපයෝගී කර ගෙන තිබුණි.

(ආ) නිශ්චිත කාර්යයක් සඳහා ලබා දී තිබුණු රු. 11,974,374 ක් වූ පරිත්‍යාග 44ක් 2005 දෙසැම්බර් වන විටත්, එම කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණු අතර, ඇතැම් අවස්ථාවල පරිත්‍යාග ලබා දෙන අය විසින් සඳහන් කර තිබුණු කාර්යයන්ට පරිබාහිර කාර්යයන් සඳහා එම මුදල් වැය කර තිබුණි.

(ඇ) කෘෂිකර්ම විද්‍යා පීඨයේ චක්‍රීය අරමුදලින් වියදම් දැරීම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

I. 2005 අගෝස්තු 24 දින දක්වා වියදම් ඇස්තමේන්තු ලබා නොගෙන අවස්ථා 06ක දී මෙම අරමුදලින් රු. 320,000ක අත්තිකාරම් ලබා දී තිබුණු අතර, කලින් ලබා ගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

II. ඇතැම් අවස්ථාවලදී, නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී, ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි.

III. අරමුදල යටතේ ප්‍රධාන නිෂ්පාදන වූ යෝගට් හා මාංශමය ආහාර වර්ග සඳහා ප්‍රමිත පිරිවැයක් ගණනය කර ඇතත්, ඒ අනුව, තථ්‍ය නිෂ්පාදනය හා තථ්‍ය යෙදවුම් අතර විචලනය ගණනය කර නොතිබුණු අතර, ඒ සඳහා අවශ්‍ය තොරතුරු ද ලේඛනගත කර නොතිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව හා ඇප බැඳුම්කර කඩ කර, විදේශගත වූ ආචාර්යවරු 19 දෙනෙකුගෙන් අය විය යුතු මුදල් ඔවුන්ට හිමි අර්ථසාධක අරමුදලින් අය කරන ලෙස දන්වා ඇතත්, මෙතෙක් එම මුදල් අය කර ගෙන නොතිබුණු අතර, අර්ථසාධක අරමුදලේ ශේෂය ඉක්මවා තිබූ ඇප බැඳුම්කරවල වටිනාකම වූ රු. 80,28,128ක් ඇපකරුවන්ගෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ග මඟින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයීය පුස්තකාල සඳහා 2003 සහ 2004 වර්ෂ තුළ දී වාර සඟරා ලබා ගැනීම වෙනුවෙන් දායක මුදල් වශයෙන් රු. 38,555ක් ගෙවා ඇතත්, 2005 දෙසැම්බර් 31 දින තෙක් අදාළ වාර සඟරා පුස්තකාලයට ලැබී නොතිබුණු අතර, අදාළ මුදල අය කර ගැනීමට ද ක්‍රියා කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් කපා හරින ලද රු. 1.01,06,077ක් වූ අත්තිකාරම්, ණයගැති, ණයහිමි හා තැන්පත් ශේෂ හඳුනා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුගමනය කළයුතු යැයි නියම කර ඇති කාර්යය පරිපාටි අනුගමනය කර නොතිබුණි.

3.5 හඳුනා ගන්නා ලද පාඩු :

පහත සඳහන් පාඩු නිරීක්ෂණය විය.

(අ) උද්‍යාන පාලක තනතුර සඳහා අයදුම් කර තිබුණු නමුත්, බඳවා නොගත් අයදුම්කරුවෙකු විසින් පවරන ලද නඩුවකින් දෙන ලද තීන්දුවක් මත එම අයදුම්කරු වෙත රු. 25,000ක වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) ඉංජිනේරු පීඨයේ පුස්තකාලයාධිපතිනිය විසින් 2004 හා 2005 වර්ෂය සඳහා විදේශීය සඟරා දෙකක් ඇණවුම් කර තිබිය දී, ප්‍රධාන පුස්තකාලයාධිපති විසින් ද, එම විදේශීය සඟරා දෙක ඇණවුම් කිරීම හේතුවෙන්, රු. 3,11,207ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව කඩ කළ කථිකාචාර්යවරුන් 38 දෙනෙකුගේ ලිපි ගොනු අස්ථානගත වීම හේතුවෙන්, ඇප බැඳුම්කරවලින් රු. 75,73,673ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

3.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් :

පහත සඳහන් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් නිරීක්ෂණය විය.

(අ) වාහන 12ක් ස්වභාවික ආපදාවන්ට ලක් වෙමින් විශ්ව විද්‍යාල භූමියේ දිරාපත් වීමට ඉඩ හැර තිබුණි.

(ආ) උද්‍යාන අංශය වෙත ලබා දී තිබුණු ජීප් රථයක් 2002 වර්ෂයේ සිට සහ කෘෂිකර්ම විද්‍යා පීඨයේ පාංශු විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථයක් 2004 දෙසැම්බර් සිට 2005 සැප්තැම්බර් දක්වා ද නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2001 වර්ෂයේ දී ජයිකා ආධාර යටතේ ලබා දී තිබුණු දන්ත වෛද්‍ය උපකරණවලින් කොටසක් විධිමත්ව ලේඛනගත කිරීමකින් තොරව 2005 වර්ෂය අවසන් වන විටත් නිෂ්ක්‍රීයව කාමරවල ගොඩ ගසා තිබුණි.

(ඈ) 2005 නොවැම්බර් 08 දින වන විට රු. 1,13,898 ක් වූ තොග, වර්ෂ ගණනාවක් තුළ භාවිතයට ගෙන නොතිබුණි.

3.7 ව්‍යතිරේක විෂයයන් :

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලය විසින් දීර්ඝ කාලයක් තිස්සේ පරිහරණය කර තිබුණු පොල්ගොල්ල, දොඩංගොල්ල සහ මහඉලුප්පල්ලම පිහිටි ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ආ) පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව සහ සුදුසුකම්ලත් නිලධාරියකුගේ නිර්දේශයක් රහිතව විදේශ ආධාර ලෙස ලැබී තිබුණු, වාහනයකට වෙනත් වාහනයක ඩීසල් එන්ජිම සවිකර තිබුණු අතර, එම රථයේ ලියාපදිංචිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.8 අයවැය පාලනය :

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පැරණි වෛද්‍ය ගොඩනැගිල්ල සඳහා වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් රු. 2,00,00,000ක් ද, ගොඩනැගිලි සඳහා වූ ප්‍රතිපාදනවලින් රු. 44,38,450ක් ද, අනුමැතියකින් තොරව මූලධන වත්කම් පුනරුත්ථාපන ගිණුමට මාරු කර වැය කර තිබුණි.

(ආ) වැය විෂයයන් 23ක් යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා රු. 28,05,69,104 ක් වැය කර තිබුණු අතර, මේ හේතුවෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලක කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.9 ශිෂ්‍ය පිරිවැය :

සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී රු. 34,588ක වැඩි වීමක් නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන :

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) මුදල් හා බැංකු ගිණුම්
(ආ) මිල දී ගැනීම්
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) පුස්තකාල කටයුතු
(ඉ) අත්තිකාරම්
(ඊ) ස්ථාවර වත්කම්
(උ) තොග පාලනය හා ඉන්වෙන්ට්‍රිගත කිරීම්
(ඌ) වාහන පාලනය
(එ) ලේඛන පැවැත්වීම.

එස්. සී. මායාදුන්නේ,
විගණකාධිපති.

9.3 2005 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

| *විස්තරය* | *සටහන් අංකය* | *ලේඛන අංකය* | *පිටු අංකය* | *පොදු අරමුදල විශ්ව විද්‍යාලය* | *පොදු අරමුදල බාහිර විභාග ඒකකය* | *නැගෙනහිර හා යාපනය විශ්ව විද්‍යාල වලින් අවතැන් වූ සිසුන් සඳහා වූ ඒකකය* | *එකතුව 2005 රු. ශත.* | *එකතුව 2004 රු. ශත.* |
|---|---|---|---|---|---|---|---|---|
| *වත්කම්* : | | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | |
| දේපළ යන්ත්‍රෝපකරණ හා උපකරණ | 01 | H, H1 | 14-16 | 3,416,221,684.82 | 2,454,985.51 | 2,00 | 3,418,676,672.33 | 3,635,485,622.43 |
| කෙරීගෙන යන වැඩ | 02 | A | 17 | 270,981,209.34 | | | 270,981,209.34 | 148,380,002.18 |
| සීමාවලට යටත් කරන ලද ආයෝජන – 1 | 03 | I | 18-22 | 69,299,657.47 | | | 69,299,657.47 | 66,158,000.62 |
| සීමාවලට යටත් කරන ලද ආයෝජන – 2 | 03 | J | 23-34 | 186,965,689.59 | | | 186,965,689.59 | 173,142,812.87 |
| | | | | **3,943468,241.22** | **2454,985.51** | **2.00** | **3,945,923,22873** | **4,023,166438.10** |
| **ජංගම වත්කම් :** | | | | | | | | |
| තොග | 05 | K | 35 | 35,028,296.71 | 1,451,986.43 | | 36,480,283.14 | 40,001,650.57 |
| මාර්ගස්ථ තොග - 80010240 | 06 | K-1 | 32-35 | 18,275,728.82 | | | 18,275,728.82 | 18,453,099.45 |
| ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම් සඳහා | | | | | | | - | |
| ආචාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු -12016200 | 07 | K-2 | 41-43 | 66,765,739.19 | | | 66,765,739.19 | 67,407,403.98 |
| වෙනත් විශ්ව විද්‍යාලවලින් හා | | | | | | | - | |
| ආයතනවලින් ලැබිය යුතු මුදල් | 08 | Q | 44 | 149,476.38 | 59,217,660.68 | 3,819,554.49 | 13,837,697.24 | 14,220,570.55 |
| විවිධ ණයහිමියෝ - විවිධ | 09 | L | 45 | 14,876,725.11 | | | 14,876,725.11 | 15,888,569.63 |
| සැපයීම් හා සේවා සඳහා අත්තිකාරම් | 10 | P | 46 | 3,368,114.05 | | | 3,368,114.05 | 5,843,053.81 |
| ණය හා අත්තිකාරම් - සිසුන් සඳහා | 11 | N | 47 | 1,450.00 | | | 1,450.00 | 278,945.00 |
| ණය හා අත්තිකාරම්-කාර්ය මණ්ඩල සඳහා | 12 | M | 48 | 88,050,718.73 | 2,081,576.00 | 28,141.90 | 90,160,436.63 | 100,766,562.93 |
| විවිධ අත්තිකාරම් | 13 | O | 49 | 8,989,610.12 | 124,253.35 | | 9,113,863.47 | 13,499,725.53 |
| පූර්ව ගෙවීම් | 14 | R | 50 | 3,049.90 | | | 3,049.90 | 3,049.90 |
| බැංකුවල මුදල් – මුදල් පොත් ශේෂය | 15 | S | 51-52 | 94,417,413.23 | 499,192.77 | 7,606.35 | 94,924,212.35 | 71,818,579.54 |
| | | | | **329,926,322.34** | **63,374,669.23** | **3,855,30274** | **347,807,299.90** | **348,181,210.89** |
| **මුළු වත්කම්** | | | | **4,273,394,56346** | **65,829,65474** | **3,855,30474** | **4,293,730,528.63** | **4,371,347,648.99** |

**වගකීම්**

**ජංගම වගකීම්**

| විස්තරය | සටහන් අංකය | ලේඛන අංකය | පිටු අංකය | පොදු අරමුදල විශ්ව විද්‍යාලය | බාහිර විභාග ඒකකය | නැගෙනහිර හා යාපනය විශ්ව විද්‍යාල වලින් අවතැන් වූ සිසුන් සඳහා වූ ඒකකය | එකතුව 2004 රු. ශත. | එකතුව 2004 රු. ශත. |
|---|---|---|---|---|---|---|---|---|
| තැන්පතු | 16 | U | 53 | 5,372,997.50 | 4,903.16 | | 5,377,900.66 | 6,084,149.58 |
| වෙනත් විශ්ව විද්‍යාලවලට හා | | | | | | | | |
| ආයතනවලට ගෙවිය යුතු මුදල් | 17 | W | 54 | 28,337,452.13 | | 903,982.84 | 903,982.84 | 900,303.34 |
| විවිධ ණයගැතියෝ | 18 | T | 55 | 38,490,907.03 | 373,364.61 | 45,990.52 | 17,898,719.98 | 17,737,128.21 |
| වියදම් ණයගැතියෝ | 19 | V | 56 | 7,686,099.53 | 1,351,036.27 | | 9,037,135.80 | 18,783,197.54 |
| මුළු වගකීම් | | | | 79,887,456.19 | 1,729,304.04 | 949,973.36 | 33,217,739.28 | 43,504,778.67 |
| මුළු ශුද්ධ වත්කම් | | | | 4,193,507,107.27 | 64,100,350.70 | 2,905,331.38 | 4,260,512,789.35 | 4,327,842,870.32 |
| **ශුද්ධ වත්කම්/හිමිකාරිත්වය** | | | | | | | | |
| **ප්‍රාග්ධනය** | | | | | | | | |
| 1. ප්‍රාග්ධනය - වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | | | | 1,893,365,304.52 | 1,073,686.50 | 1,097,232.67 | 1,895,536,223.69 | 1,800,581,326.64 |
| 2. ප්‍රාග්ධනය - වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන | | | | | | | | |
| කෙරීගෙන යන වැඩ | 20-1 | A | 17 | 201,249,261.52 | | | 201,249,261.52 | 92,616,873.13 |
| 3. වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන-ගොඩනැගිලි | 20-1 | A | 57 | 21,256,729.25 | | 536,342.33 | 21,793,071.58 | 14,171,828.33 |
| **4. විශේෂ සංචිත** | | | | | | | | |
| වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන උපකරණ | | | | | | | | |
| ලී බඩු, පුස්තකාල පොත් හා වාර සඟරා | 20-2 | B | 58 | 7,600,769.07 | | | 7,600,769.07 | 28,295,117.35 |
| **4. බී. පුනරුත්ථාපන** | | | | | | | | |
| 1. පුනරුත්ථාපන - වියදම් කළ ප්‍රදාන | | | | | | | | |
| ප්‍රාග්ධන ස්වභාවයේ කෙරීගෙන යන වැඩ | | | | 69,731,947.82 | | | 69,731,947.82 | 52,946,763.19 |
| 2. පුනරුත්ථාපන වැය නොවූ ප්‍රදාන | 20-3 | B:1 | 59 | (2,374,964.93) | | | (2,374,964.93) | 312,987.18 |
| 3. පරිත්‍යාග - ගොඩනැගිලි | | | | 1,225,094,707.50 | | | 1,225,094,707.50 | 1,225,101,020.00 |
| පරිත්‍යාග (වත්කම්) | | | | 1,050,246,405.74 | | | 1,050,246,405.74 | 988,622,335.11 |
| විදේශ ආධාර | | | | 537,765,951.84 | | | 537,765,951.84 | 500,745,951.84 |
| **සංචිත** | | | | | | | | |
| 1. නිශ්චිත වත්කම් - නැවත තක්සේරු කළ සංචිත | | | | 2,440,915,018.34 | 4,542,658.83 | | 2,445,457,677.17 | 2,445,457,677.17 |
| 2. ආයතනයේ පොදු සංචිතය | | | | (4,084,321,138.05) | 53,975,062.85 | 1,229,356.40 | (4,029,116,718.80) | (3,514,208,615.51) |
| 3. විශ්‍රාමික පාරිතෝෂිකය | | | | 441,089,375.15 | | | 441,089,375.15 | 328,374,943.00 |
| **3. සීමාවලට යටත් අරමුදල්** | | | | | | | | |
| .1 ඒ. ශිෂ්‍යත්ව අරමුදල | | | | 70,067,539.70 | | | 70,067,539.70 | 66,119,232.59 |
| 1 බී. ශිෂ්‍යාධාර අරමුදල | 22 : 1 | C | 53-59 | | | 42,400.00 | 42,400.00 | 42,400.00 |
| 2. විශේෂ ප්‍රදාන | 22 : 2 | D | 71 | 1,617,917.50 | | | 1,617,917.50 | 1,613,585.00 |
| 3. පර්යේෂණ ප්‍රදාන | 22 : 3 | E | 61-66 | 86,246,671.83 | | | 86,246,671.83 | 69,007,702.18 |
| 4. මුදල් පරිත්‍යාග | | | | 60,038.09 | | | 60,038.09 | 60,038.09 |
| 5. වෙනත් අරමුදල් | 22 : 4 | G | 61-66 | 233,895,572.38 | 4,508,942.50 | | 238,404,514.88 | 227,981,705.09 |
| | | | | **4,193,507,107.27** | **64,100,350.68** | **2,905,331.40** | **4,260,512,789.35** | **4,327,842,870.32** |

නිවැරදි බවට සහතික කරන ලද්දේ,

| | | |
|---|---|---|
| මහාචාර්ය කපිල ගුණසේකර, | එම්. එස්. එම්. මුස්තාපා, | ඒ. සිවගුරු, |
| උපකුලපති. | වැඩබලන ලේඛකාධිකාරී. | වැඩබලන මුල්‍යාධිකාරී. |

9.4 2005 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ගිණුම් වාර්තාව - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

| | | 2005 | | 2005 | 2004 |
|---|---|---|---|---|---|
| | *සටහන්* | *පොදු අරමුදල* | | *මුළු එකතුව* | *මුළු එකතුව* |
| | *විශ්ව විද්‍යාලය* | | *බාහිර විභාග අංශය* | | |
| | *ශ්‍රී ලංකා රු. ශත* | *ශ්‍රී ලංකා රු. ශත* | *ශ්‍රී ලංකා රු. ශත* | *ශ්‍රී ලංකා රු. ශත* | *ශ්‍රී ලංකා රු. ශත* |
| මෙහෙයුම් ආදායම | | | | | |
| *පුනරාවර්තන ප්‍රදාන* | | | | | |
| *අ.* රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 1,185,275.000.00 | - | - | 1,185,275,000.00 | 932,410,000.00 |
| | | | | – | |
| *වෙනත් ආදායම්* | | | | – | |
| *ආ.* ස්ථිර තැන්පතු ආපසු ගැනීම්වලින් මුදල් | - | - | - | – | - |
| *ඇ.* රජයේ ප්‍රදාන - ශිෂ්‍යාධාර | 14,953,200.00 | - | - | 14,953,200.00 | 10,848,950.00 |
| *ඈ.* රජයේ ප්‍රදාන - මහපොළ ශිෂ්‍යත්ව | 36,453,600.00 | | | 36,453,600.00 | 14,252,200.00 |
| | | 1,236,681,800.00 | | 1,236,681,800.00 | 957,511.150.00 |
| *නඩත්තු කටයුතු සඳහා පුනරුත්පාපන ප්‍රදාන* | | 36,176,371.11 | | 36,176,371.11 | 29,533,503.90 |
| ආයෝජන වලින් පොලී | 10,250,968.67 | | - | 10,250,968.67 | 9,731,661.24 |
| කාර්ය මණ්ඩල ණය වලින් පොලී | 3,818,535.32 | | 82,659.33 | 3,901,194.65 | 4,946,532.16 |
| දේපළවල කුලී ආදායම | 3,615,869.62 | | | 3,615,869.62 | 4,591,648.37 |
| පරණ භාණ්ඩ විකුණුම් ආදායම | 111,447.50 | | | 111,447,50 | 991,525.50 |
| නිෂ්පාදන වලින් ආදායම | 72,054.95 | | | 72,054,95 | 70,365.00 |
| ප්‍රතිපූර්ණයන් | - | | - | - | - |
| විවිධ ලැබීම් | 8,117,314.34 | | 134,716.30 | 8,252,030.64 | 9,871,198.52 |
| ලියාපදිංචි ගාස්තු (උපාධිලාභී සිසුන්) | 1,856,628.00 | | 5,868,376.50 | 7,725,004.50 | 5,834,297.50 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි සිසුන්) | | | | - | - |
| දේශන ගාස්තු (උපාධිලාභී සිසුන්) | | | | - | 30,985.00 |
| දේශන ගාස්තු (පශ්චාත් උපාධි සිසුන්) | 957,690.28 | | | 957,690.28 | - |
| විභාග ගාස්තු (උපාධිලාභී සිසුන්) | 881,634.00 | | 3,967,390.00 | 4,849,024.00 | 9,740,323.00 |
| විභාග ගාස්තු (පශ්චාත් උපාධි සිසුන්) | | | | - | - |
| ප්‍රකාශන වලින් ආදායම | 121,200.00 | | 1,729,650.00 | 1,850,850.00 | 939,212.00 |
| පුස්තකාල දඩ | 423,518.66 | | | 423,518.66 | 447,885.09 |
| වෛද්‍ය ගාස්තු | 331,396.50 | | | 331,396.50 | 302.205.00 |
| අනුයාත සේවා වලින් ලැබීම | 8,006,925.40 | **38,565,183.24** | | 8,006,925.40 | 8,102,251.06 |
| | | **1,311423,354.35** | **11,782,792.13** | **1,323,206,14648** | **1,042,644,743.34** |
| *මෙහෙයුම් වියදම්* | | | | | |
| වැටුප් හා වේතන | 1,127,547,295.90 | | 8,788,125.34 | 1,136,335,421.24 | 841,445,050.16 |
| ගමන් වියදම් | 4,293,911.64 | | 9,650.00 | 4,303,561.64 | 3,595,465.79 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ පාවිච්චිය | 56,237,053.49 | | 860,920.96 | 57,097,974.45 | 55,071,834.59 |
| නඩත්තු වියදම් | 4,671,459.16 | | 84,309.25 | 4,755,768.41 | 5,539,205.29 |
| කොන්ත්‍රාත් සේවා | 114,743,012.05 | | 1,081,428.59 | 115,824,440.64 | 110,895,856.66 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 124,298,522.95 | | 4,050,880.64 | 128,349,403.59 | 81,759,281.77 |
| ක්ෂය වීම් හා කාලීන ණය නිදහස් කිරීමේ වියදම් | 397,757,015.04 | | 658,419.21 | 398,415,434.25 | 374,309,280.15 |
| මුළු මෙහෙයුම් වියදම් | | **1,829,548,270.23** | **15,533,733.99** | **1,845,082,004.22** | **1472,615,974.41** |
| කාල වකවානුව සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය) | | **(518,124,915.88)** | **(3,750,941.86)** | **(521,875,857.74)** | **(429,971,231.07)** |

9.5 2005 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ වගුව.

| | 2005 | 2004 |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| 1. මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය | | |
| සාමාන්‍ය කටයුතුවලින් අතිරික්තය/හිඟය | (521,875,857.74) | (429,971,231.17) |
| *ගැලපීම්* | | |
| ක්ෂයවීම් | 398,415,434.25 | 374,309,280.15 |
| පාරිතෝෂිත දීමනා හා වෙනත් ගැලපීම් | 139,089,980.00 | 89,382,094.50 |
| පොලී ආදායම් | (10,250,968.67) | (9,731,661.24) |
| මෙයෙයුම් අතිරික්තය/(හිඟය) කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට ප්‍රථම | 5,378,587.84 | 23,988,482.24 |

| | 2005 රු. ශත | 2004 රු. ශත |
|---|---|---|
| *කාරක ප්‍රාග්ධන වෙනස්කම්* | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | 3,521,367.43 | (12,381,131.92) |
| මාර්ගස්ථ තොග (වැඩිවීම)/අඩුවීම | 177,370.63 | 1,656,998.85 |
| බැඳුම්කර කඩකිරීම් ආදියෙන් ලැබිය යුතු (වැඩිවීම)/අඩුවීම | 641,664.79 | (2.,746,721.07) |
| වෙනත් විශ්ව විද්‍යාලවලින් ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | 382,873.21 | (541,214.27) |
| විවිධ ණයකරුවෝ (වැඩිවීම)/අඩුවීම | 1,011,844.52 | (3,811,798.18) |
| සැපයීම් හා අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 2,474,939.76 | 3,242,851.23 |
| ශිෂ්‍යයන් සඳහා ණය හා අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 277,495.00 | 600.00 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය හා අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 10,606,126.30 | 3,201,727.02 |
| විවිධ අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 4,385,862.06 | (3.065,630.65) |
| අත්තිකාරම් නැවත ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | - | 746,284.84 |
| ආපසු ගෙවන තැන්පතු (වැඩිවීම)/අඩුවීම | (706,248.92) | 74,368.04 |
| විවිධ ණය හිමියෝ (වැඩිවීම)/අඩුවීම | 161,591.77 | 6,197,999.57 |
| අනෙකුත් විශ්ව විද්‍යාලවලට ගෙවිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | 3,679.50 | (2,642.50) |
| වියදම් ණය හිමියෝ (වැඩිවීම)/අඩුවීම | (9,746,061.74) | 5,616,709.31 |
| පාරිතෝෂිත ගෙවීම් | (26,375,518.00) | |
| මෙහෙයුම් කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය | (7,804,425.26) | 22,176,882.51 |
| 2. ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර වත්කම්වලට හා කෙරීගෙන යන වැඩවලට එකතු කිරීම් | (90,036.756.00) | (228,224,313.90) |
| කෙරීගෙන යන වැඩ | (122,601,207.00) | 98,505,829.12 |
| සීමාවලට යටත් ආයෝජන i | (3,141,656.85) | (4,752,331.28) |
| සීමාවලට යටත් ආයෝජන ii | (13,822,876.70) | (25,812,316.69) |
| පොළී ආදායම | 1,638,364.00 | 8,604,068.69 |
| සවයං මූල්‍ය ව්‍යාපෘතීන් | (168,376,795.19) | (149,738,116.99) |
| ආයෝජනවලදී ශුද්ධ මුදල් ප්‍රවාහය | (396,340,927.74) | (301,417,181.05) |
| 3. ගිණුම් කටයුතුවල මුදල් ප්‍රවාහය | | |
| රජයේ ප්‍රතිපාදන | | |
| උපකරණ, පොත් හා වාර සහරා සඳහා | 88,982,500.00 | 20,000,000.00 |
| ගොඩනැගිලි වැඩ සටහන | 96,817,500.00 | 19,500,000.00 |
| ප්‍රාග්ධන ස්වභාවයේ පුනරුත්ථාපන | 55,000,000.00 | 43,000,000.00 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | - | 38,500,000.00 |
| ද්‍රව්‍යමය පරිත්‍යාග (ශික්ෂණ හා විද්‍යාගාර උපකරණ) | - | 21,092,350.29 |
| ස්වයං මූල්‍ය ව්‍යාපෘතීන් | 186,450,986.00 | 154,496,205.25 |
| ගිණුම් කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහය | 427,250,986.00 | 296,588,555.54 |
| මුදල් හා ආසන්න මුදල් මගින් ශුද්ධ වැඩිවීම් | 23,105,633.00 | 17,348,257.00 |
| වර්ෂාරම්භයේ මුදල් හා ආසන්න මුදල් | 71,818,579.00 | 54,470,322.00 |
| වර්ෂාවසානයේ මුදල් හා ආසන්න මුදල් | 94,924,212.00 | 71,818,579.00 |

9.6 2005 දෙසැම්බර් මස 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

| *විස්තරය* | 2005 පොදු අරමුදල විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකා රු. ශත | බාහිර විභාග ඒකකය ශ්‍රී ලංකා රු. ශත | 2005 මුළු එකතුව ශ්‍රී ලංකා රු. ශත | 2004 මුළු එකතුව ශ්‍රී ලංකා රු. ශත |
|---|---|---|---|---|
| වියදම ඉක්ම වූ ආදායම | (518,124,915.88) | (3,750,941.86) | (521,875,857.74) | (429,971,231.17) |
| පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | (3,573,163,976.62) | 57,726,004.73 | (3,515,437,971.89) | (3,088,124,586.68) |
| **එකතු කළා**– පෙර වර්ෂවල ආදායම් හා වෙනත් ගැළපිළි | 18,693,450.07 | | 18,693,450.07 | 3,665,045.96 |
| | (4,072,595,442.43) | 53,975,062.87 | (4,018,620,379.56) | (3,514,430,771.89) |
| **අඩු කළා**- පෙර වර්ෂවල ගෙවීම් හා වෙනත් ගැලපිළි | (8,614,612.73) | - | | |
| ලියා හරින ලද නොසැසඳුන ගිණුම්වල ශුද්ධ අගය | (3,111,082.89) | - | (8,614,612.73) | (1,007,200.00) |
| ශේෂ පත්‍රයට ගෙන ආ ශේෂය | **(4.084.321.138.05)** | **53.975.062.87** | **(4.027.234.992.29)** | **(3,515,437,971.89)** |

| මහාචාර්ය කපිල ගුණසේකර | එම්. එස්. එම්. මුස්තාපා | ඒ. සිවගුරු |
|---|---|---|
| උපකුලපති | වැඩබලන ලේඛකාධිකාරී | වැඩබලන මූල්‍යාධිකාරී |

9.7 2005 දෙසැම්බර් මස 31න් අවසන්වන කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය

| | සමුච්චිත අරමුදල රු. ශත | නැවත ඇගයීම් කළ සංචිත රු. ශත | පරිවර්තන සංචිත රු. ශත | එකතුව රු. ශත |
|---|---|---|---|---|
| 2003 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 2,076,573,732.32 | 2,445,457,677.17 | - | 4,522,031,409.49 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනා නොගත් ශුද්ධ ලාභය හා පාඩුව | 235,782,692.00 | - | - | 235,782,692.00 |
| කාලවකවානුව සඳහා අතිරික්තය/හිඟය | (429,971,231.17) | - | - | (429,971,231.17) |
| 2004 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 1,882,385,193.15 | 2,445,457,677.17 | - | 4,327,842,870.32 |
| මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනා නොගත් ශුද්ධ ලාභය හා පාඩුව | 454,545,776.77 | - | - | 454,545,776.77 |
| අතිරික්තය/(හිඟය) 2005 දෙසැම්බර් මස 31 දිනෙන් | (521,875,857.74) | - | - | (521,875,857.74) |
| අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා | 1,815,055,112.18 | 2445457,677.17 | - | 4,260,512,789.35 |

9.8 1971 අංක 38 දරන මුදල් පනතේ 13(06) කොටසෙහි සඳහන් උපදෙස් පරිදි 2005 වසර සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව

1. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 106(1) හා 107(b) යන කොටස් හා ඉන් පසුව කරන ලද සංශෝධනවලට අනුකූලව මෙම ගිණුම් ප්‍රකාශනය සකස් කරන ලදී.

2. කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ආයතන දෙකෙහි ගිණුම් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විගණකාධිපතිගේ උපදෙස් පරිදි මහා භාණ්ඩාගාරයෙන් පැහැදිලිකර ගන්නා ලදී. මහා භාණ්ඩාගාරයෙන් (පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ/වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂක මගින් 2003 ඔක්තෝබර් මස 15 දාතමැති. යොමු අංක PE/168/4/2003) ලැබුණ උපදෙස් මත මෙම ආයතන දෙකෙහි මූල්‍ය ප්‍රකාශන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් නොකරන ලදී.

3. පොදුවේ විශ්ව විද්‍යාලය මගින් වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කරන පිළිවෙල අනුගමනය කරමින් ද රජයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ක්‍රම භාවිතා කරමින්ද අනුකූලතාවය පවත්වා ගනිමින් ද ගිණුම් ඉදිරිපත් කිරීම හා පැහැදිලි කිරීම සිදු කරන ලදී.

| *01. රජයේ ප්‍රදාන :* | | | *2004* | *2005* |
|---|---|---|---|---|
| (1). | පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | රු. | 932,410,000.00 | 1,173,100,000.00 |
| (ii) | පුනරාවර්තන වියදම් සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂමෙන් ලැබුණු ප්‍රදාන | රු. | - | 12,175,000.00 |
| (iii) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කෘෂිවිද්‍යා පීඨයට ලැබුන විශේෂ ප්‍රදාන/භාණ්ඩාගාරය හරහා/පුනරාවර්තන | රු. | 250,000.00 | 250,000.00 |
| (iv) | මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රදාන | රු. | 14,252,200.00 | 36,453,600.00 |
| (v.) | මූල්‍යාධාර සඳහා රජයේ ප්‍රදාන | රු. | 10,848,950.00 | 14,953,200.00 |
| (vi) | ප්‍රාග්ධන 101 - පුනරුත්ථාපන වැඩසටහන | රු. | 43,000,000.00 | *55,000,000.00 |
| (vii) | ප්‍රාග්ධන 102 - උපකරණ පොත්පත් හා වාර සඟරා | රු. | 48,000,000.00 | 80,982,500.00 |
| (viii) | ප්‍රාග්ධන 103 - ගොඩනැගිලි වැඩසටහන | රු. | 19,500,000.00 | 86,317,500.00 |
| ix) | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය/පේරාදෙණිය විශ්ව විද්‍යාලය | රු. | 9,000,000.00 | |
| (x) | කෘෂිකාර්මික පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයෙන් මහ ඉලුප්පල්ලම මණ්ඩපය සඳහා විශේෂ ප්‍රදාන | රු. | 590,541.00 | |
| (xi) | තොරතුරු තාක්ෂණය ඉහළ නැංවීම පරිගණක ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ වැඩි කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා ඉංජිනේරු පීඨයට : | | | |
| | පුස්තකාල ස්වයංක්‍රීයකරණය | රු. | 500,000.00 | 6,000,000.00 |
| | කලා පීඨයේ තොරතුරු තාක්ෂණය ඉහළ නැංවීම (කළමණාකරණ ශිෂ්‍යයන්) | රු. | 1,500,000.00 | 2,500,000.00 |
| | වෘත්තීයය මාර්ගෝපදේශ කටයුතු | | 500,000.00 | 5,000,000.00 |
| | පොදු | රු. | 1,000,000.00 | – |
| (xii) | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණ අතිරේක වෙන් කිරීම | | | – |
| | SIDA ආයතනයේ මූල්‍යාධාර සපයන ලද විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශයේ ව්‍යාපෘතියක් වන පර්යේෂණ ධාරිතා වර්ධනය | රු. | 1,006,307.00 | - |

| *01. රජයේ ප්‍රදාන* | | *2004* | *2005* |
|---|---|---|---|
| xiii. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශයේ වැඩි දියුණුව සඳහා තොරතුරු තාක්ෂණ අරමුදල | රු. | 10,000,000.00 | **5,000,000.00 |
| එකතුව | රු. | 1,092,357,998.00 | 1,477,731,800.00 |
| xiv. ස්වයං මූල්‍ය ප්‍රතිපාදන | | 154,496,205.00 | 186,450,986.00 |

*2004 වසරේ වෙන් කරන ලද නමුත් 2005 වසරේ දී ලද රු. මිලියන 10ද ඇතුළත් වේ.

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් 2004 වසරට වෙන් කරන ලද නමුත් 2005 වසරේදී ලැබුණ.

විගණන මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2005 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව, මාගේ වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇති වන බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය ප්‍රකාශයන්හි දී ඇති සටහන්වල (සටහන් අංක ඒ සිට එෆ්) දක්වා ඇති පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත්, එමගින් 2005 දෙසැම්බර් මස 31 දිනට විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වයෙහි සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

විගණනයේ දී උද්ගත වූ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අමතන ලද සම දින දරන මාගේ වාර්තාවේ ඇතුළත්ව ඇත.

එස්. සී. මායාදුන්නේ,
විගණකාධිපති.

2006 ජූලි මස 06 වැනි දින,
කොළඹ 07,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

12-448

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900001652.

ණයකරුගේ සම්පූර්ණ නම : රත්නතිලක දුරයලගේ ශ්‍රියානි ශාන්තිලතා.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සී. එම්. බී. බෝගොල්ලාගම විසින් ලියා සහතික කරන ලද 17619 හා 1999.08.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස් පන්දහස් තුන්සිය අනූහතරයි ශත හැට අටක (රු. 55,394.68) මුදලක් වර්ෂ 2005.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

1. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතළිස් තුන්දහස් පන්සිය හැට දෙකයි ශත අසූ පහක (රු. 43,562.85) මුදල ද වර්ෂ 2005.05.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් එකොළොස්දහස් අටසිය තිස් එකයි ශත අසූ තුනක (රු. 11,831.83) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස් පන්දහස් තුන්සිය අනූහතරයි ශත හැටඅටක් (රු.55,394.68) ද,

2. එකී රුපියල් හතළිස් තුන්දහස් පන්සිය හැට දෙකයි ශත අසූපහක (රු. 43,562.85) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොලියක් 2005.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

3. එකී 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මඟින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005 ක් වූ ජූනි මස 28 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදිහත් පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, වාරියපොළ ප්‍රාදේශීය සභා සීමාවේ, කොස්සාව ග්‍රාමයෙහි පිහිටි කොස්සාවවත්ත නමැති ඉඩමට 1998.02.18 දින සරත් වලගෙදර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3570ඒ පිඹුර ප්‍රකාර ලොට් 30 සහ 31 ට මායිම්, උතුරට : එම පිඹුරේම කැබලි අංක 32 ද ; නැගෙනහිරට : එම පිඹුරේම කැබලි අංක 34 සහ 35 ද ; දකුණට : එම පිඹුරේම කැබලි අංක 29හි ලකුණු කරන ලද පාර ද :; බටහිරට: කැබලි අංක 26බී ලකුණු කරන ලද අඩි 18ක් පළල පාර යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක (අක්. 0, රූඩ් 0, පර්. 30) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද මාර්ග පරවශතාවය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1123/263 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

12-616

---

### සීමාසහිත සම්පත් බැංකුව

#### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

ගිණුම් අංකය : 0001 1006 1137.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004 ජනවාරි 09 දින පවත්වන ලද රැස්වීමේ දී, විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන්, පහත දැක්වෙන යෝජනාව සම්මත කරගන්නා ලදී :

සීමාසහිත සම්පත් බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. ඊ. විජේරත්න විසින් ලියා සහතික කරන ලද අංක 2024 හා 1999 පෙබරවාරි 25 දින ද අංක 2242 හා 2000 පෙබරවාරි 18 දින ද, අංක 2535 හා 2003 මැයි 19 දින ද, දරන උකස් බැඳුම්කර, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. කේ. ඒ. ගුණතිලක විසින් ලියා සහතික කරන ලද අංක 1760 හා 1997 අගෝස්තු 15 දින දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. ඊ. විජේරත්න ලියා සහතික කළ අංක 2327 හා 2000 ජනවාරි 10 දින ද අංක 2536 හා 2003 මැයි 19 දින ද උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මහර, කඩවත, පහළ බියන්විල, මල්වත්ත පාර, අංක 170/1 දරන ස්ථානයේ "ක්‍රිස් ඇපරල්ස්" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරය කරගෙන යන, මහර, කඩවත, පහළ බියන්විල, මල්වත්ත පාර, අංක 170/1 දරන ස්ථානයේ මුනුගොඩ හේවගේ කරුණාසේන සහ රීටා මුණසිංහ යන අය විසින් එකී උකස් බැඳුම්කරවල බන්ධනදායීන් වශයෙන් සහ එකී මුනුගොඩ හේවගේ කරුණාසේන යන අය උකස්කරු වශයෙන් ද සිටිමින් පැහැර හැර ඇති හෙයින් ද, 2003 ජුනි 16 වන දිනට එකී බැඳුම්කර මත අයවිය යුතු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින්, රුපියල් හැත්තෑහතර ලක්ෂ විසිහතර දහස් පන්සිය තිස් දෙකකුත් ශත හැට හතරක (රු. 74,24,532.64) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට ලැබිය යුතු හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑහතර ලක්ෂ විසිහතර දහස් පන්සිය තිස් දෙකකුත් ශත හැට හතරක් (රු. 74,24,532.64) ක්වූ මුදල සහ 2003 ජුනි මස 17 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් පනස්එක් ලක්ෂ විසි දහසක් (රු. 51,20,000) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් ද, රුපියල් දසලක්ෂ හැත්තෑ දහසක් (රු. 10,70,000) සඳහා වර්ෂයකට සියයට දොළහ (12%) බැගින් ද, රුපියල් තුන්ලක්ෂ හාරදහස් හත්සිය අනූහයකුත් ශත දහසයක් (රු. 3,04,796.16) සඳහා වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් ද වූ වැඩිදුර පොළිය සහ ප්‍රචාරක ගාස්තු හා වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ, ඉන්පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 2024, 2242, 2555 සහ 1760, 2327 හා 2536 ද දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ ද මෙහි පිළිවෙලින් පළමුවන හා දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍ර කොළඹ, ප්‍රසිද්ධ වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි. 1990 අංක 4 දරන, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ පහළ බියන්විල, මල්වත්ත පාරේ පිහිටි වරිපනම් අංක 13/5 දරන මිල්ලගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ඒ. කටුගම්පොල විසින් මැන සාදන ලද අංක 105/1995 හා 1995 නොවැම්බර් 06 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් 'ඒ' ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එෆ්. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 9343 හා 1985 ජුනි 26 දින දරන පිඹුරේ ලොට් අංක 1 දරන බිම් කට්ටියේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : එකී අංක 9343 දරන පිඹුරේ ලොට් අංක 2 දරන බිම් කට්ටිය (පාර) ද, දකුණට : ලොට් 'බී' දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : ලොට් අංක 7 හි ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත ඉහත සඳහන් අංක 105/1995 දරන පිඹුර ප්‍රකාර පර්චස් දෙකකුත් දශම හතරයි තුනක් (අ. 0, රූ. 0, ප. 2.43) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 609/186 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී පහළ බියන්විල, මල්වත්ත පාරේ පිහිටි, වරිපනම් අංක 13/5 දරන, මිල්ලගහ වත්ත නමැති ඉඩමේ, ඉහත කී අංක 105/1995 දරන පිඹුරේ දැක්වෙන, ලොට් 'බී' ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් 'ඒ' දරන කට්ටිය ද, නැගෙනහිරට : ඉහත කී අංක 9343 දරන පිඹුරේ (අඩි 12ක් පළල පාර සඳහා වෙන් කළ) ලොට් අංක 2 ද, දකුණට : අඩක 9343 දරන පිඹුරේ ලොට් අංක 3 සහ ලොට් 'සී' දරන කට්ටිය ද, බස්නාහිරට : ලොට් 'එෆ්' දරන කට්ටිය ද මායිම් ඇතුළත ඉහත සඳහන් අංක 105/1995 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයකුත් දශම තුනයි බින්දුවක් (අ. 0, රූ. 0, ප. 9.30) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් ය. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 500/269 වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී පහළ බියන්විල, මල්වත්ත පාරේ පිහිටි, වරිපනම් අංක 13/5 දරන, මිල්ලගහවත්ත නමැති ඉඩමේ, ඉහත කී අංක 105/1995 දරන පිඹුරේ දැක්වෙන ලොට් 'සී' ලෙස ලකුණු කළ බෙදාවෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් 'බී' දරන කට්ටිය ද, නැගෙනහිරට : ඉහත කී අංක 9343 දරන පිඹුරේ ලොට් අංක 3 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 'ඩී' සහ ලොට් 'ඊ' දරන කට්ටි ද යන මායිම් ඇතුළත පර්චස් අටකුත් දශම දෙකයි හතක් (අ. 0, රූ. 0, ප. 8.27) විශාලත්වය ඇති ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 500/282 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මෙයට ඉහත සඳහන් අංක 105/1995 දරන පිඹුරේ දැක්වෙන පාරවල් සඳහා වෙන්කර තිබෙන බිම මතින් මාර්ග අයිතියද ඇතුළත් වේ.

## දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, පහළ බියන්විල, මල්වත්ත පාරේ, අංක 13/6හි පිහිටි 'මිල්ලගහවත්ත' නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු වී.එෆ්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 9343 හා 1985 ජුනි 26 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 3 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 6 ද, නැගෙනහිරට : ලොට් අංක 2 සහ කරත්ත පාර ද, දකුණට : කරත්ත පාර සහ බස්නාහිර : ලොට් අංක 4 ද යන මායිම් ඇතුළත, ඉහත සඳහන් අංක 9343 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයකුත් දශම තුනයි නවයක් (අ. 0. රූ. 0, ප. 10.39) විශාලත්වය ඇති ඉඩම සහ එහි ගසකොළ, වැවිලි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇති ඉඩම. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 560/232 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගමේ ලේකම්.

12-625/4

---

## මහජන බැංකුව-රත්නපුර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. පී. ප්‍රේමචන්ද්‍ර විසින් සහතික කරන ලද අංක 2182 හා 2004.04.23 දිනැති උකස්කරය හා ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන මහතා විසින් සහතික කරන ලද අංක 1301 හා 2005.04.20 දිනැති උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම පහළ ගමරාළලාගේ උපාලි ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී උකස්කරයන් යටතේ දැනට පළමු ණය මුදල සඳහා රු. 8,25,100 (රුපියල් අටලක්ෂ විසිපන්දහස් එකසීයක) මුදලක් හා 2004.07.21 දින සිට වර්ෂයකට 14.25% (සියයට දහහතරයි දශම දෙකයි පහක්) බැගින් හා දෙවැනි ණය මුදල සඳහා රු. 6,53,000ක් (රුපියල් හයලක්ෂ පනස් තුන් දාහක මුදලක්) 2005.08.29 වැනි දින සිට වර්ෂයකට 14.25% (සියයට දහ හතරයි දශම දෙකයි පහක්) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී පළමු ණය මුදල සඳහා රු. 8,25,100ක් හා දෙවැනි ණය මුදල සඳහා රු. 6,53,000ක මුදලක් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක 2182 සහ 1301 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, දකුණු උඩ පත්තුවේ, කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ තැඹිලියන පිහිටි පුහුවලවත්ත හෙවත් පුහුලකනත්ත හෙවත් ඩිස්පෙන්සරිය වත්ත නමැති ඉඩමට අවසරලත් මානක එම්. වර්ණසූරිය මහතා විසින් මැන සාදන ලද පිඹුරු අංක 138 සහ 1999.06.17 දින දරන පිඹුරේ සඳහන් ඒකාබද්ධ කැබලි අංක 1, 2 හා 3 යන ඉඩම්වල, උතුරට : ඩිස්පෙන්සරිය වත්තේ උඩහ කැබැල්ල ද, නැගෙනහිරට : කොළඹ-රත්නපුර මහා මාර්ගය ද, දකුණට : අගල ද, බස්නාහිරට : දොඹගහඇල ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසි හතරයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 24.3) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි සියලුම දේ ද වේ.

මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 593/298 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
රත්නපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය,
රත්නපුර.

12-632

---

## සීමාසහිත සෙලාන් බැංකුව - කඩවත ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.08.29 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් සියල්ලම සහතික කරන ලද 1998 අගෝස්තු මස 17 දිනැති අංක 157 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මාකොල පදිංචි අතුකෝරලගේ ජයසේන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ පනස්තුන් දහස් දෙසීය පනස්හතයි ශත අටක (රු. 4,53,257.08) මුදලක්, 2006 මාර්තු මස 04 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 4,53,257.08 මුදල ද, 2006 මාර්තු මස 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 157 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකොල උතුර පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 1997.09.10 දිනැති අංක 80/97 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොඩපරගහවත්ත හෙවත් මිල්ලගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක ඒ ලකුණු කළ හොරලන්ද පාරේ වරිපනම් අංක 25/2 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. ඒ. විලියම් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : වී. සී. පාර ද, දකුණට : අඩි 12ක් පළල පාර සහ බස්නාහිරට : අංක 1755 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 2 ද යන මායිම් තුළ එකී අංක 80/97 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් හයයි දශම තුනයි තුනක් (අ. 0, රූ. 1, පර්. 6.33) විශාල ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රුරුව සී 455/140හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-599

---

සෙලාන් බැංකුව පීඑල්සී - වවුනියාව ශාඛාව
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0720-08002470-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇති) ප්‍රසිද්ධ නොතාරිස් එම්. සිත්තම්පලම් විසින් සියල්ලම සහතික කරන ලද 1995 ඔක්තෝබර් මස 09 දිනැති අංක 1144, 1996 අගෝස්තු මස 07 දිනැති අංක 1813 සහ 1988 අප්‍රේල් මස 08 දිනැති අංක 3199 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, වවුනියාව පදිංචි කන්දශාමි රවින්ද්‍රදාස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි පනස්හයදහස් දෙසිය අනූ හතයි ශත එකක (රු. 1,00,56,297.01) මුදලක්, 2006 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,00,56,297.01 මුදල ද, 2006 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1144, 1813 සහ 3199 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුව පී. එල්. සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව දකුණ කිලකුමුලෙයි දකුණ වවුනියාව පිහිටි බලයලත් මිනින්දෝරු කේ. රත්නසිංහම් විසින් සාදන ලද 1975.11.05 දිනැති අංක 305 දරන මිණුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පනෙයිඅඩිවලවු පනිච්චායියදීලුල් වලවු සහ පනෙයිඅඩිලුල්තෝඩ්ඩම් නමැති ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසිහයක් (අ. 0, රූ. 1, පර්. 26)ක් විශාල ඉඩම.

මෙම ඉඩමෙන් නිරිත දිශාවට පෙර කී අංක 305 දරන සැලැස්මේ කැබලි අංක 2 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදූ ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වන ඉඩම් කොටසට මායිම්, උතුරට : කණපතිපිල්ලෙයි බාලසේගරන් ට හිමි පෙර කී අංක 305 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ද, නැගෙනහිරට : කණපතිපිල්ලෙයි බාලසේගරන්ගේ දේපළ ද, දකුණට : පෙර කී අංක 305 දරන සැලැස්මේ පෙන්වන පරිදි ප්‍රවේශය ද, බස්නාහිරට : කිතුල් පාර ද වේ. මෙය වවුනියාව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රුරුව සී 53/168, සි 53/269 සහ සී 53/270හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-600/2

---

සෙලාන් බැංකුව පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0880-01146038-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 නොවැම්බර් මස 14 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇති) ප්‍රසිද්ධ නොතාරිස් රාමලිංහම් තිරුකුමාරනන්දන් විසින් සහතික කරන ලද 2003 ජනවාරි මස 23 දිනැති අංක 1781 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ත්‍රිකුණාමලය පදිංචි ඥාණපිරගාසම් ශ්‍රීධරන් යන අය බන්ධනදායී

වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ අසූනවදහස් තුන්සිය විසිඅටයි ශත හැට දෙකක (රු. 9,89,328.62) මුදලක්, 2007 ජූනි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 9,89,328.62 මුදල ද, 2007 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1781 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුච්චවේලි ප්‍රාදේශීය සභා සීමාව තුළ නිලාවැලි වෝඩ් අංක 2 ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. මහේන්ද්‍රනාදන් විසින් සාදන ලද 2001.10.10 දිනැති අංක 482 දරන සැලැස්මේ සඳහන් පලනිතාරෙයි නමැති ඉඩමේ කැබලි අංක ඊ ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම සහ පරිශ්‍රයට මායිම්, උතුරට : පෙර කී අංක 482 දරන සැලැස්මේ සඳහන් ඩී කැබැල්ල ද, නැගෙනහිරට : පෙර කී අංක 482 දරන සැලැස්මේ සඳහන් එෆ් කැබැල්ල (පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : කුච්චවේලි සිට ත්‍රිකුණාමලය පාර සහ බස්නාහිරට : ටී. සිදිරවේලු විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පර්චස් තිහයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 30.10) ක් විශාල ඉඩම. මෙය ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී 45/154 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-601/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - පොළොන්නරුව ශාඛාව
### 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0531-01512281-001 සහ 0531-01512281-002.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ඔක්තෝබර් මස 17 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. රවුෆ් විසින් දෙකම සහතික කරන ලද 2004 නොවැම්බර් මස 10 දිනැති අංක 770 සහ 2005 අගෝස්තු මස 30 දිනැති අංක 980 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම පොළොන්නරුව පදිංචි ගොඩගම ගමගේ ප්‍රේමසිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි තිස්තුන්ලක්ෂ හැටහත්දහස් එකසිය හැටහයයි ශත විසි නවයක (රු. 1,33,67,166.29) මුදලක්, 2006 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,33,67,166.29 මුදල ද, 2006 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 770 සහ 980 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි සහ දෙවැනි උපලේඛන වල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව අතුමල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 155 නිශ්ශංකමල්ලපුර පිහිටි මිනුම්පති විසින් සාදා තමා භාරයේ තබා ගන්නා ලද එෆ්එස්පීපී 3950 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 729ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : 709 කැබැල්ල ද, නැගෙනහිරට : 729බී කැබැල්ල (කොටසක්), කැබලි අංක 730 ද, දකුණට : කැබලි අංක 730 සහ බස්නාහිරට : කැබැලි අංක 670 ද යන මායිම් තුළ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි එකයි තුනක් (හෙක්ටයාර් 0.213) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා, වැවිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එල්ඩීඕ 5/33/2/57 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව අතුමල්පිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 155 නිශ්ශංකමල්ලපුර පිහිටි මිනුම්පති විසින් සාදා තමා භාරයේ තබා ගන්නා ලද එෆ්එස්පීපී 3950 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 729බී (කොටසක්) ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : 709 කැබැල්ල ද, නැගෙනහිරට : 710 කැබැල්ල, දකුණට : කැබලි අංක 730 (පාර) සහ බස්නාහිරට : කැබැලි අංක 729ඒ ද යන මායිම් තුළ හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි දෙකයි පහ (හෙක්ටයාර් 0.325) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා, වැවිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එල්ඩීඕ 5/33/2/71 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

12-600/1

## සීමාසහිත සෙලාන් බැංකුව - මරදාන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0470-01261235-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ජූලි මස 09 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999 පෙබරවාරි මස 25 දිනැති අංක 1545 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 12 පදිංචි මොහමඩ් යූසුප් මොහමඩ් නසාර් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහත්ලක්ෂ හතලිස් දෙදහස් දෙසිය පනස් තුනයි ශත විසිතුනක (රු. 27,42,253.23) මුදලක්, 2006 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 27,42,253.23 මුදල ද, 2007 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1545 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

(1) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ මහ නගර සභාව තුළ ගාල්ල මහමෝදර පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 18 වැනි දිනැති අංක 1589ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහමෝදරවත්ත හි කොටසක් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කළ දැන් කොළඹ පාර වරිපනම් අංක 266බී දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 6 ද, නැගෙනහිරට : අංක 1355 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 7 ද, දකුණට : කොළඹ පාර සහ පාර සහ බස්නාහිරට : එකී 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 2 ද යන මායිම් තුළ එකී අංක 1589ඒ දරන සැළැස්ම අනුව පර්චස් හයක් (අ. 0, රූ, 0, පර්. 6) *නොහොත්* (හෙක්ටයාර් 0.0152) විශාල ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 533/163 යටතේ ලියාපදිංචි කර ඇත.

(2) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ මහ නගර සභාව තුළ ගාල්ල මහමෝදර පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 18 වැනි දිනැති අංක 1589ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහමෝදරවත්ත හි කොටසක් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබැලි අංක 2 ලකුණු කළ දැන් කොළඹ පාර වරිපනම් අංක 266ඒ දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 4 ද, නැගෙනහිරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 1 ද, දකුණට : කොළඹ පාර සහ පාර සහ බස්නාහිරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 ද යන මායිම් තුළ එකී අංක 1589ඒ දරන සැළැස්ම අනුව පර්චස් හයක් (අ. 0, රූ, 0, පර්. 6) *නොහොත්* (හෙක්ටයාර් 0.0152) විශාල ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 533/164 යටතේ ලියාපදිංචි කර ඇත.

(3) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ මහ නගර සභාව තුළ ගාල්ල මහමෝදර පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 18 වැනි දිනැති අංක 1589ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහමෝදරවත්ත හි කොටසක් නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබැලි අංක 3 ලකුණු කළ දැන් කොළඹ පාර වරිපනම් අංක 266 දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 4 ද, නැගෙනහිරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 2 ද, දකුණට : කොළඹ පාර සහ පාර සහ බස්නාහිරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක ආර් 1 (පාර සඳහා වෙන් කිරීම) ද යන මායිම් තුළ එකී අංක 1589ඒ දරන සැළැස්ම අනුව පර්චස් හයක් (අ. 0, රූ, 0, පර්. 6) *නොහොත්* හෙක්ටයාර් 0.0152 විශාල ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 533/165 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින්, යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග :

පෙර කී මහමෝදර පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 18 දිනැති අංක 1589ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහමෝදරවත්ත හි කොටසක් නමැති ඉඩමේ කැබලි අංක ආර් 1 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 1589ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක ආර්2 (පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : එකී අංක 1569ඒ දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 32, 31, 30, ආර්5 (පාර සඳහා වෙන් කිරීම), 28, 27, 26, ආර්5 (පාර සඳහා වෙන් කිරීම) 22, 21, 20, ආර් 4, (පාරක් සඳහා වෙන් කිරීම) 15, 14, 13, 12, ආර් 3 (පාර සඳහා වෙන් කිරීම) 5, 4 සහ 3 ද, දකුණට : කොළඹ පාර සහ වෙන් කළ ඉඩම සහ බස්නාහිරට : පාර (අංක 1355 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 9) ද යන මායිම් තුළ එකී අංක 1589ඒ දරන සැළැස්ම අනුව පර්චස් විසිහතයි දශම පහයි අටක් (අ. 0, රූ. 0, පර්. 27.58) *නොහොත්* හෙක්ටයාර් 0.0698 විශාල ඉඩම. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඒ 437/344 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

12-601/2

---

## මහජන බැංකුව-හික්කඩුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ඔක්තෝබර් මස 26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2005.11.23 දිනැති අංක 243 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් තංගල්ල

ලියනගේ ශ්‍රියාණි සහ වල්පිට ගමගේ කරුණාසිංහ යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හත්ලක්ෂ තිස්දහස් දෙසිය අනූඅටයි ශත තිස් දෙකක (රු. 7,30,298.32) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.06.27 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් හත්ලක්ෂ තිස්දහස් දෙසීය අනූඅටයි ශත තිස්දෙක (රු. 7,30,298.32)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ තිස්දහස් දෙසිය අනූඅටයි ශත තිස් දෙකක (රු. 7,30,298.32) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 243 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩන්දූව පින්කන්ද පිහිටි සුදුමැටිය පින්කන්දවත්ත *හෙවත්* ගංහේවාගේ මතෙස් පදිංචි පින්කන්දෙවත්ත අංක 3 දරන කැබැල්ල බෙදා වෙන් කළ 3ඒ දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න මහතා විසින් වර්ෂ 1999.01.19 දින මැන සාදන ලද අංක 3502 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට අංක 491 දරන පිඹුරේ සඳහන් අංක 3 දරන කැබැල්ලේ කොටසක් සහ ගම්සභා පාර ද, නැගෙනහිරට : පිංකන්දේ සිට බේරතුඩුවට යන ගම්සභා පාර ද, දකුණට : අංක 491 දරන පිඹුරේ සඳහන් අංක 2 සහ අංක 4 දරන කැබලි ද, බස්නාහිරට : අංක 491 දරන පිඹුරේ සඳහන් අංක 2 සහ අංක 3 දරන කැබැල්ලේ කොටසක් ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සියළු දේ ද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 652/240 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

12-629

---

### මහජන බැංකුව-අම්බලන්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.20 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ඩී. එම්. පීරිස් විසින් සහතික කරන ලද 1999.06.08 දිනැති අංක 2117 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රා ලමාහේවාගේ විසින් සහතික කරන ලද 2004.03.23 දිනැති අංක 1104 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම මල්ලියාවඩු ලෝලිත ප්‍රසාද් ද සිල්වා සහ මල්ලියාවඩු ඇන්ඩෲ නිකලස් සීසර් ද සිල්වා යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ අසූහාරදහසක (රු. 3,84,000) මුදලක් සහ රුපියල් මිලියන තුනක මුදලක් (රු. 30,00,000) මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.02.05 දින සිට වර්ෂයට 25% බැගින් රුපියල් තුන්ලක්ෂ අසූහාරදහසක (රු. 3,84,000) මුදලක් සහ 2004.08.31 දින සිට වර්ෂයට 18.75% බැගින් රුපියල් මිලියන තුනක මුදලක් (රු. 30,00,000) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ අසූහාරදහසක (රු. 3,84,000) මුදලක්, සහ රුපියල් මිලියන තුනක මුදලක් (රු. 30,00,000) අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ විසින් එකී අංක 1104 සහ 2117 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සහා සීමාව තුළ කොල්ලුපිටියේ ඩින්ස්ටන් පෙදෙසේ වරිපනම් අංක 59හි පිහිටි කැබලි අංක 18A3Z ට බලයලත් මානක එස්. එච්. බී. ජෝසප් විසින් 1975.07.12 දින සකස් කළ අංක සී/38/75 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : වර්තමානයේ ජේම්ස් ඉයුබෝල්ඩ් ඇනස්ලි ජිනදාසට සහ මාරි ජෙරල්ඩීන් කැලිස්ටා ජිනදාසට *විවාහයට පෙර* ෆොන්සේකාට වෙන වෙනම අයිති ඩීල් පෙදෙසේ ඒහි අංක 26 පරිශ්‍රයේ පිහිටා ඇති අංක 18A1X සහ 18A2X දරන ඉඩම් කැබලි, නැගෙනහිරට : කැබලි අංක 18A2X (බලයලත් මානක ඒ. ආර්. සෙවුන්දනායගම් විසින් සකස් කළ 1927.09.25 දිනැති අංක 2242 පිඹුරේ කැබලි අංක X10 නැවත බෙදීමකි) ද, දකුණට : ඩීන්ස්ටන් පෙදෙස සහ බස්නාහිරට : ඩීල් පෙදෙසේ ඒ හි වරිපනම් අංක 24 දරන පරිශ්‍රය යන මෙකී සීමා තුළ වූ පර්චස් දහසයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 16.5) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියළු දෑ වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 557/294 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

12-630

---

### සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0038 1000 0776-මාෂා හාල් මෝල.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කදුරුවෙල, මුස්ලිම් කොලනියේ අංක 59 දරන ස්ථානයේ 'මාෂා හාල් මෝල' යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන අකුරණ බුලුගහතැන්න අංක 62/1 හි පදිංචි අබ්දුල් හමීඩ් කයිරුන් නීසා බීබී සහ හන්දෙස්ස දවුලගල අංක 215/A හි පදිංචි අබ්දුල් අසීස් මොහමඩ් සලීම් යන දෙදෙනා බන්ධනදායී වශයෙන් සහ එකී අකුරණ බුලුගහතැන්න අංක 62/1හි පදිංචි අබ්දුල් බමහීඩ් කයිරුන් නීසා බීබී යන අය උකස්කරු වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ඔක්තෝබර් මස 16 දාතම හා අංක 4077 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2007 මැයි මස 31 වන දින ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් දෙලක්ෂ පන්දහස් එකසිය හැට එකකුත් ශත හැටපහක්(රු. 42,05,161.65 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හතලිස් දෙලක්ෂ පන්දහස් එකසිය හැට එකකකුත් ශත හැට පහක (රු. 42,05,161.65 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් තිස්නව ලක්ෂයක (රු. 39,00,000 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් 2007 ජුනි මස 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වොතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 4077 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.".

## උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාතේ උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත දවුලුගල ග්‍රාමයේ පිහිටි ගෙලිඔය පාරේ වරිපනම් අංක 11 දරන ලියනගස්තැන්න වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2006 ජුනි 22 දාතම හා අංක 6715 දරන පිඹුරේ නිරූපිත උතුරට : එච්. එම්. ඒ. ෆරීඩ්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. එච්. ජයිනුදීන්ට අයත් කුඹුර ද, දකුණට : අබ්දුල් කාදර්ට අයත් දැනට මුසාමිල් අයිතිය කියන ඉඩම ද හා බටහිරට : ගෙලිඔය සිට මහනුවර දක්වා මාර්ගය ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරක් (අක්. 0, රූ. 0, පර්. 34) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්. ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියලුම අයිතීන් මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමගය.

එකී ඉඩම පහත විස්තර කෙරෙන ඉඩමේ ප්‍රති මිනුමකි :

ඉහත කී දවුලුගල පිහිටි ලියනගස්තැන්න වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. ඩී. ජී. කේ. ජී. රොඩ්රිගෝ විසින් සාදන ලද 1975 ජනවාරි 25 සහ 1975 පෙබරවාරි 15 දාතම හා අංක 785 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට සහ ඊසාන දෙසට : එකී අංක 785 පිඹුරේ ලොට් 3 ද, ගිනිකොණ දෙසට : ඒ. එච්. ජයිනුදීන් ට අයත් කුඹුරද, දකුණට : අබ්දුල් කාදර්ට අයත් ඉඩමද, සහ බටහිරට පාර ද මායිම්වන ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරක් (අක්. 0, රූඩ්. 0, පර්. 34) වන බෙදා වෙන් කොට සීමා නිර්ණයය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සහ එයට අදාළ සියලුම අයිතීන් මාර්ග වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග, එකී අංක 785 දරන පිඹුර මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී397/42 හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

12-625/7

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංක : 1800001027.

ණයකරුගේ සම්පූර්ණ නම : සමරකෝන් මුදියන්සේලාගේ කුමාරසිරි සමරකෝන්.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. හේවාපතිරණ විසින් ලියා සහතික කරන ලද අංක 3751 හා 2001.09.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා(සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස් එක් දහස් හැටයි හත එකොළහක (රු. 2,31,060.11) මුදලක් වර්ෂ 2005.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ අනූහය දහස් පන්සිය විසිනවයයි ශත හැට තුනක (රු. 1,96,529.63) මුදල ද වර්ෂ 2005.10.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස් හතර දහස් පන්සිය තිහයි ශත හතලිස් අටක් (රු. 34,530.48) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්එක් දහස් හැටයි ශත එකොළහක් (රු. 2,31,060.11) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ අනූහය දහස් පන්සිය විසිනමයයි ශත හැටතුනක (රු. 1,96,529.63) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොලියක් 2005.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ ජනවාරි මස 24 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉහළ විසිදෙකේ කෝරළේ, හිරියාල හත්පත්තුවේ, ගොපල්ලව ග්‍රාමයෙහි පිහිටි බෝගහමුල වෙලේ වත්ත නමැති ඉඩමට 2000.10.09 දින එච්. විජයතුංග මානක තැන විසින් මැන සම්පාදිත අංක 1098 පිඹුර ප්‍රකාර ලොට් 1බීට මායිම්, උතුරට : එච්. එම්. හීන්බණ්ඩාට සහ අනෙක් අයට අයත් කුඹුරු ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ගොකරැල්ල සිට කොස්වත්ත දක්වා වූ ප්‍රධාන පාර සහ බටහිරට : ලොට් 1 ඒ ද, යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් නමයයි දශම දෙකක (අක්. 0, රූඩ් 1, පර්. 9.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 546/282 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

12-615

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංක : 0042 5000 9718-වී. ගනේෂන්.

2007 අප්‍රේල් මස 26 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 11, කෙයිසර් වීදියේ, අංක 180/03/15C හි පදිංචි වීරප්පන් ගනේෂන් යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. ගමලත් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලංසූරිය විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ පිළිවෙලින් 2004 නොවැම්බර් 12 දාතම හා අංක 565 දරණ උකස් බැඳුම්කරය සහ 2006 මාර්තු 22 දාතම හා අංක 139 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2007 මාර්තු මස 08 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් තුන් ලක්ෂ අසූ එක් දහස් අටසිය තිස් දෙකකුත් ශත පනස් පහක (53,81,832.55 ක් පමණයි) මුදලක් එකී බැඳුම්කරය මගින් මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිගව ඇති හෙයින් එකී රුපියල් පනස්තුන් ලක්ෂ අසූ එක්දහස් අටසිය තිස් දෙකකුත් ශත පනස් පහක (රු. 53,81,832.55ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සහ තවත් රුපියල් තිස් එක් ලක්ෂ තිස් තුන් දහස් අසූ හතරකුත් ශත හතළිස් තුනක(රු. 31,33,084.43 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුන (13%) බැගින්ද තවත් රුපියල් දහනව ලක්ෂ අසූනම දහස් හත්සිය අනූ දෙකකුත් ශත දෙකක (රු. 19,89,792.02 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහහතර (14%) බැගින් 2007 මාර්තු මස 09 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග, එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 565 සහ 139 දරණ බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.".

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කූරු කෝරලේ රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභාවේ පරිපාලන සීමාව ඇතුලත පිහිටි කෝකියාහේන නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද 2004 මාර්තු මස 10 දාතම හා අංක 2119 A දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ B 926/142 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2119ඒ පිඹුරට අනුව උතුරට : ලොට් 2 (පාර සඳහා වෙන් කළ කොටස) ද නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ජේ.නානායක්කාර විසින් සාදන ලද අංක 1463 දරන පිඹුරෙහි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. ගුණසෝම විසින් සාදන ලද සත්‍ය උධෘතයෙහි ලොට් 6බී ද, දකුණට : කාණුව සඳහා වෙන් කළ කොටස ද, සහ බටහිරට : බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් සාදන ලද 1967 දෙසැම්බර් 20 දාතම හා අංක 1855 දරන පිඹුරේ ලොට් ඒ 1 ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම හතයි බිංදුවක් (අක්. 0, රූඩ්. 0, පර්. 7.70) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සහ එයට අදාල සියළුම අයිතීන් මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග පහත දැක්වෙන ඉඩම් මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

1. කොළඹ ඉඩම් කාර්යාලයේ B 926/143 හි ලියාපදිංචි කොට ඇති ඉහත කී අංක 2119 A පිඹුරේ ලොට් 2,
2. කොළඹ ඉඩම් කාර්යාලයේ B 929/27 හි ලියාපදිංචි කොට ඇති 1968 දෙසැම්බර් 17 වන දින සංශෝධනය කළ පරිදි 1967 දෙසැම්බර් 20 දාතම හා අංක 1855 දරන පිඹුරේ ලොට් අංක B 2,
3. කොළඹ ඉඩම් කාර්යාලයේ B 888/209 හි ලියාපදිංචි කොට ඇති ඉහත කී අංක 1855 පිඹුරේ ලොට් A 3.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

12-625/6

---

## මහජන බැංකුව-මොරටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.26 වැනි දින පැවැත්වූ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්දිමා ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද 2004.07.09 දිනැති අංක 1681 හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්.

ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද 2006.02.27 දිනැති අංක 6264 දරන උකස්කරයත් ප්‍රකාර ගෙවීම, ගමගේ දොන් පියසේන මහතා, ගමගේ දොන් චන්ද්‍රන ප්‍රියන්ත මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ පනස්දෙදහස් එකසිය අනූ නවයයි ශත හැටහයක් (රු. 4,52,199.66) සහ රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හයසිය හැටහයයි ශත හැට හතරක් (රු. 3,46,666.64) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.02.14 දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් රුපියල් හාරලක්ෂ පනස්දෙදහස් එකසිය අනූනවයයි ශත හැටහයක් (රු. 4,52,199.66) සහ 2006.03.01 දින සිට වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් රුපියල් තුන්ලක්ෂ හතිලිස්හයදහස් හයසිය හැටහයයි ශත හැටහතරක් (රු. 3,46,666.44) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ '29එල්' (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ පනස් දෙදහස් එකසිය අනූ නවයයි ශත හැටහයක (රු. 4,52,199.66) හා රුපියල් තුන්ලක්ෂ හතලිස් හයදහස් හයසිය හැටහයයි ශත හැට හතරක (රු. 3,46,666.64) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1681 හා 6264 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තිරණය කරයි.

## උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, රාවතාවත්ත යන ගම ශ්‍රමදාන මාවතේ පිහිටි 'බරඉන්නෙවත්ත සහ වඩුගේවත්ත' නම් වූ එකට යාවූ ඉඩමේ B2 දරන කොටසට එල්. ආර්. එල්. පෙරේරා බලයලත් මිනින්දෝරු මහතා විසින් 1970.08.03 දින මැන සාදන ලද අංක 1064 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : අඩි 15 පළල පාර ද, නැගෙනහිරට : අඩි 14ක් පළල පාරක් සහ ඇන් මාර්තා මැන්දිස්ට අයත් ඉඩම ද, දකුණට : ඇන් කැතරින් ප්‍රනාන්දුට තිබී දැනට ලිලියන් මැන්දිස්ට අයත් ඉඩම ද, බස්නාහිරට : බී1 දරන කට්ටිය ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් දහයයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 10.25) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ.

ඉහත සඳහන් ඉඩම්, බලයලත් මානක එම්. ඩී. එන්. ප්‍රනාන්දු මහතා විසින් 1994.12.15 දින මැන සකස් කළ අංක 3270 දරන පිඹුර ප්‍රකාර පහත සඳහන් අන්දමට මෙසේද විස්තර වේ.

එකී රාවතාවත්ත යන ගම පිහිටි, ඉහත කී ඉඩමෙන්, බෙදූ කැබලි අංක 1 දරන වරිපනම් අංක 12, ශ්‍රමදාන මාවතේ පිහිටි, ඉඩමට ඉහත කී අංක 3270 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ශ්‍රමදාන මාවත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 2 ද, දකුණට : සී. වීරසේකර, මෙරිල් සහ තවත් අයට අයත් ඉඩම් ද, බස්නාහිරට : හෙට්ටිආරච්චි යන අයට අයත් ඉඩම ද, යන මෙකී මායිම් තුළ වූ පර්චස් නවයයි දශම එකයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 9.10) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේද වේ.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2313/283 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාප II)

12-627

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවි ධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 අප්‍රේල් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමෙකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ගිණුම් අංකය : 1003 5043 7651.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිටකෝට්ටේ, කුරුඳුවත්ත පාරේ, අංක 62/1හි පදිංචි තනිප්පුලි ආරච්චිගේ බියංකා ජීවන්ති සහ පලාකෙටි පිටියගේ පියතිලක යන දෙදෙන බන්ධන්දායින් වශයෙන් කොළඹ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. කේ. ගමලත් විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 නොවැම්බර් මස 05 දාතම හා අංක 553 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පාරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 පෙබරවාරි මස 20 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය දහසයකුත් ශත හැටපහක් (රු. 1,143,316.65)ක් පමණයි. එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හා හිඟව ඇති හෙයින් එකී රුපියල් එකොලොස් ලක්ෂ හතලිස් තුන්දහස් තුන්සිය දහසයකුත් ශත හැටපහක (රු. 1,143,316.65) ක් පමණයි සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් එකොලොස් ලක්ෂ නවසිය හතලිස් දෙකකුත් ශත අසූතුනක (රු. 1,100,942.83ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් 2007 පෙබරවාරි මස 21 වැනි දිනට සිට වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 553 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

## ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට ගමේ පිහිටි මැදවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2004 ජනවාරි මස 20 දාතම හා අංක 2469 දරන පිඹුරේ ලොට් 2සී2 වශයෙන් ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ G1029/273හි ලියාපදිංචි කොට ඇති එකී අංක 2469 පිඹුරට අනුව උතුරට : අංක 2395 පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 2C5 ද, දකුණට : අංක 459 පිඹුරේ ලොට් 2D2, අංක 3429 පිඹුරේ ලොට් 2E සහ අංක 2469 පිඹුරේ ලොට් 2C3 (නමුත් අංක 3429 පිඹුරේ ලොට් 2C3 හා 2E සහ අංක 459 පිඹුරේ ලොට් 2D2 ලෙස ලියාපදිංචි කොට ඇති) ද සහ බස්නාහිරට : අංක 2469 පිඹුරේ ලොට් 2C3 සහ ලොට් 2C4 ද, මායිම්වන ප්‍රමාණයෙන් පර්චස් දාහතරක් (අ. 0, රූ. 0, පර්. 14) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහ කොළ, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාල සියලුම, අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමඟ

පහත දැක්වෙන ඉඩම් මතින් මාර්ග අයිතිය ද සමඟය

1. හෝමාගම ඉඩම් කාර්යාලයේ G1029/274හි ලියාපදිංචි කොට ඇති ඉහත කී අංක 2469 පිඹුරේ නිරූපිත ලොට් 2C3 (අඩි 12ක් පළල පාර)

2. හෝමාගම ඉඩම් කාර්යාලයේ G1029/272 යටතේ ලියාපදිංචි කොට ඇති ඇති බලයලත් මිනින්දෝරු පී. පී. ඩයස් විසින් සාදන ලද 1998 මැයි 3 දාතම හා අංක 459 දරන පිඹුරේ නිරූපිත ලොට් 2D2 (අඩි 12ක් පළල පාර)

3. හෝමාගම ඉඩම් කාර්යාලයේ G1029/7 යටතේ ලියාපදිංචි කොට ඇති බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් සාදන ලද 1995 දෙසැම්බර් මස 29 දාතම හා අංක 3429 දරන පිඹුරේ නිරූපිත ලොට් 2E (අඩි 12ක් පළල පාර)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

12-625/3

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

යූ. එල්. අයි. එස්. කේ. විජේසේන - ගිණුම් : අංක 0023 1600 2028.

2007 අගෝස්තු මස 30 වන දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දුම්මලසූරිය, පලුගමුව, කෙළින් වීදියේ මොනාලිසා හි පදිංචි උපාසක ලේකම්ලාගේ ඉන්දු සමන් කුමාර විජේසේන යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2006 ජූලි 25 දාතම හා අංක 1590 සහ 1592 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2007 ජුනි මස 06 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් එක් ලක්ෂ හැත්තෑ පන්දහස් දෙසිය පහකුත් ශත අසූනමයක් (රු 3,175,205.89 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් තිස් එක් ලක්ෂ හැත්තෑ පන්දහස් දෙසිය පහකුත් ශත අසූ නවයක් (රු. 3,175,205.89 ක් පමණයි) සම්පූර්න හිඟ මුදල සමග රුපියල් විසිනව ලක්ෂ විසි එක් දහස් නවසිය අසූ හයකුත් ශත හතලිස් දෙකක (රු. 2,921,986.42 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2007 ජුනි මස 07 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එකෙත් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී අංක 1590 සහ 1592 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛයණයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යේජනා කොට සම්මත කර ගන්නා ලදී.

#### ඉහත කී උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දකුණු කටුගම්පොල කෝරලේ කටුගම්පොල හත් පත්තුවේ උඩුබද්දාව ප්‍රාදේශීය සභා සීමාව තුළ පලුගමුවේ පිහිටි අග්‍රාවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් සාදන ලද 2002 නොවැම්බර් 13 දාතම හා අංක 4952 බී දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කොල්ලුපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව කේ 206/66 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 4952 බී පිඹුරට අනුව උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අංක 4980 පිඹුරේ ලොට් 1 ද, දකුණට : මාදම්පෙ - උඩුබද්දාව මාර්ගය ද, සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූ. 0, පර්. 20) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියළුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්වද සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කළ 2006 ජූලි මස 25 දාතම හා අංක 1590 දරන උකස් බැඳුම්කරයේ බලය පරිදි බැංකුවට උකස් තබා අයිතිය පවරන ලද වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිතියම කෝරලේ කටුගම්පොල හත්පත්තුවේ බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව තුළ මුරකන්ඩියේ පිහිටි තිඹිරිගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් සාදන ලද 2002 ජනවාරි 05 දාතම හා අංක 8126 දරණ පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එම් 126/294 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 8126 දරණ පිඹුර ප්‍රකාර උතුරට : හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගයද, නැගෙනහිරට : අංක 8126 පිඹුරේ ලොට් 2 ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකයි එකක් (අක්. 0, රූ. 0, පර්. 7.11) වන බෙදා වෙන් කොට සීම නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස. ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සහ එයට අදාළ සියළුම අයිතීන්, මාර්ග, වර්ප්‍රසාද, සහන හා දාසත්වද සමගය.

ඉහත කී මුරුකන්ඩියේ පිහිටි තිඹිරිගහවත්ත නැමැති ඉඩමේ අංක 8126 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ එම් 126/293 හි ලියා පදිංචි කොට ඇති එකී අංක 8126 පිඹුර ප්‍රකාර උතුරට : හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : අංක 8082 පිඹුරේ ලොට් 3 ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බටහිරට : අංක 8126 පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම අටයි නවයක් (අක්. 0, රූ. 0, පර්. 5.89) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි හා අනෙකුත් සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

12-625/5